# ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහිව නීති ප්‍රතිසංස්කරණ

2 වන කොටස

## මාර්ගගත ලිංගික හිංසනය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2020 නොවැම්බර්

CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබූයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව

දුරකථන: +9411 2081384, +94112081385, +94112081386

ෆැක්ස්: +9411 2081388

වෙබ්: www.cpalanka.org

ඊමේල්: info@cpalanka.org

ෆේස්බුක්: www.facebook.com/cpasl

ට්විටර්: @cpasl

# පිළිගැනීම

පර්යේෂණය ක්‍රියාවලිය සිදුකර කර මෙම වාර්තාව සකසන ලද්දේ ක්‍යාති වික්‍රමනායක විසිනි. ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, භවානි ෆොන්සේකා, කුෂ්මිලා රණසිංහ සහ චාර්යා සමරකෝන් විසින් මෙම වාර්තාවෙහි මූලික කෙටුම්පත් සඳහා අදහස් ලබාදෙමින් දායක විය. වාර්තාව සංස්කරණය කරන ලද්දේ පසන් ජයසිංහ විසින් වන අතර පිටු සැකසුම අයුධ්‍යා ගජනායක විසින් කරන ලදි. පබා දේශප්‍රිය සහ උදා දේශප්‍රිය විසින් මේ සම්බන්ධයෙන් අදාල තොරතුරු සහ ඔවුන්ගේ අදහස් ලබා දීමෙන් දැක්වූ සහාය සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ස්වකීය කෘතඥතාවය පිරිනමා සිටී.

## පටුන

**පිළිගැනීම් ........ 2**

**පටුන ........ 3**

**හැඳින්වීම ........ 4**

මාර්ගගත ලිංගික හිංසනය ........ 4

මාර්ගගතව හා සාම්ප්‍රදායිකව ලිංගික හිංසනය සිදුවන ස්වභාවයන්ගේ වෙනස ........ 6

මාර්ගගත ලිංගික හිංසන සිදුවන ආකාරයන් ........ 7

**අ. මාර්ගගත දර්ශාස්වාදය ........ 9**

දර්ශාස්වාදය යනු කුමක්ද? ........ 9

පවත්නා නීතිය යටතේ එයට දඬුවම් කළ හැකිද? ........ 9

දර්ශාස්වාදය සඳහා නෛතිකමය වශයෙන් ජාත්‍යන්තරව පවතින ප්‍රතිචාර ........ 10

ශ්‍රී ලංකාවේ දර්ශාස්වාදය නම් වූ වරදක් සංස්ථාපනය කිරීම සඳහා නිර්දේශ ........ 14

**ආ. රහස්‍ය ඡායාරූප හෝ වීඩියෝ එකඟතාවයකින් තොරව බෙදා හැරීම ........ 17**

රහස්‍ය ඡායාරූප හෝ වීඩියෝ එකඟතාවයෙන් තොරව බෙදා හැරීම යනු කුමක්ද? ........ 17

පවත්නා නීතිය යටතේ එයට දඬුවම් කළ හැකිද? ........ 18

රහස්‍ය රූප හෝ වීඩියෝ එකඟතාවයකින් තොරව බෙදා හැරීම පිළිබඳ ජාත්‍යන්තර නෛතික ප්‍රතිචාර ........ 18

ශ්‍රී ලංකාව තුළ රහස්‍ය රූප හෝ වීඩියෝ බෙදා හැරීම පිළිබඳ වරදක් සංස්ථාපනය කිරීම සඳහා වන නිර්දේශයන් ........ 22

**ඇ. ලිංගික කප්පම් ගැනීම ........ 24**

ලිංගික කප්පම් ගැනීම හෙවත් ලිංගිකත්වය උද්දීපනය කරන රූප, ලිංගික ප්‍රතිලාභ හෝ මුදල් වැනි දෑ ලබා නොදුනහොත් යමෙකුගේ රහස්‍ය හෝ සංවේදී පුද්ගලික දෑ බෙදාහරින බවට තර්ජනය කිරීම යනු කුමක්ද? ........ 24

පවත්නා නීතිය යටතේ එයට දඬුවම් කළ හැකිද? ........ 25

ලිංගික කප්පම් ගැනීම පිළිබඳ ජාත්‍යන්තරමය වශයෙන් පවතින නෛතික විධිවිධානයන්හි තත්වය ........ 26

ශ්‍රී ලංකාවේ ලිංගික කප්පම් ගැනීමේ ක්‍රියාව වරදක් වශයෙන් සංස්ථාපනය කිරීම සඳහා අවැසි නිර්දේශයන් ........ 28

**මාර්ගගත ලිංගික හිංසනය සම්බන්ධයෙන් වන ඵලදායී නීති සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ ........ 29**

## හැඳින්වීම

මෙම වාර්තාව ඔස්සේ මාර්ගගත ලිංගික හිංසනය සම්බන්ධයෙන් විමර්ශනය කරයි. එහිදී, මාර්ගගත ලිංගික හිංසනය යනු කුමක්ද යන්න මුලින්ම පුළුල් ලෙස විමසා බලනු ලබන අතර එය සාම්ප්‍රදායික ලිංගික හිංසනයන්ට වඩා වෙනස් වන්නේ කෙසේද සහ එය සිදුවන්නා වූ ආකාරයන් මොනවාද යන්න පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. ඉන් අනතුරුව වැරදි ත්‍රිත්වයකට අදාළ සාපරාධී විධිවිධානවල අවශ්‍යතාවය මෙම වාර්තාව මඟින් දක්වා ඇත. එනම්, දර්ශාස්වාදය හෙවත් යමෙකු නිරුවත්ව සිටීම හෝ යම් ලිංගික ක්‍රියාවක යෙදෙමින් සිටීම නරඹමින් ලබන්නා වූ ලිංගික ආස්වාදය, අනුමැතියකින් තොරව රහස්‍ය රූප හෝ වීඩියෝ බෙදා හැරීම, සහ ලිංගිකත්වය උද්දීපනය කරන රූප, ලිංගික ප්‍රතිලාභ හෝ මුදල් වැනි දෑ ලබා නොදුනහොත් යමෙකුගේ රහස්‍ය හෝ පුද්ගලික තොරතුරු බෙදාහරින බවට තර්ජනය කිරීම එකී වැරදි ත්‍රිත්වය වන අතර, මෙම එක් එක් ක්‍රියාව අපරාධයක් වශයෙන් සංස්ථාපනය කිරීම සඳහා අවැසි නීති සම්පාදනයට අදාල නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. මෙම නීති සාර්ථකව ක්‍රියාවට නැංවීමට අවශ්‍ය රාමුවක් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමටත්, මෙම වැරදි ඵලදායී ලෙස විමර්ශනය කිරීමට, නඩු පැවරීමට හා වැළැක්වීමට අවශ්‍ය කරන්නා වූ නිර්දේශයන් මෙම වාර්තාව අවසානයේ යෝජනා වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ. මෙම වාර්තාව වූ කලී ලිංගික හිංසනයේ ව්‍යාප්තියේ සමස්ථය පිළිබඳව කරනු ලබන පරිපූර්ණ අධ්‍යයනයක් නොවන අතර, මෙය හුදෙක් අදාල විෂය ක්ෂේත්‍රයට අවැසි ප්‍රතිසංස්කරණ සඳහා ඇති විකල්පයන් සම්බන්ධයෙන් විමර්ෂණය කිරීමක් බවට සැලකිය යුතුවේ.

මෙම වාර්තාව ලිංගික හිංසනය මැඩපැවැත්වීම සඳහා අවැසි නීති ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරනු ලබන ලිපි මාලාවක II වන කොටසයි. පළමුවන කොටස මඟින් ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍යව පවත්නා නීති සම්බන්ධයෙන් සහ මෙම ක්ෂේත්‍රයෙහි නීති ප්‍රතිසංස්කරණ මන්දගාමී වූයේ මන්ද යන්න විමර්ශනය කරයි. III වන සහ IV වන කොටස් ඔස්සේ පිළිවෙලින් ස්ත්‍රී ප්‍රජනක අවයව විකෘති කිරීම සහ අම්ල හෙවත් ඇසිඩ් ප්‍රහාර අපරාධයක් වශයෙන් සංස්ථාපනය කිරීම සඳහා නිශ්චිත නීති හඳුන්වා දීමේ අවශ්‍යතාව විමසා බලනු ලබයි.

## මාර්ගගත ලිංගික හිංසනය

මාර්ගගත ලිංගික හිංසනය, හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ සයිබර් හිංසනය යන්න, කාන්තාවන්ට එරෙහි හිංසනය සහ ඊට පාදක වන හේතු සහ එහි ප්‍රතිවිපාකයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු, (මින් මතුවට මෙම වාර්තාව තුළ විශේෂ වාර්තාකරු වශයෙන් හඳුන්වනු ලැබිය හැකි) විසින් නිර්වචනය කරනු ලබන්නේ 'යම් ස්ත්‍රීයක් කාන්තාවක් වීම නිසාවෙන්ම හෝ කාන්තාවන්ට අසමාන ලෙස බලපාන ආකාරයට කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයක ස්වභාවයෙහි, ජංගම දුරකථන සහ ස්මාර්ට්ෆෝන්, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය වේදිකා හෝ ඊමේල් හෙවත් විද්‍යුත් තැපැල වැනි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීමෙන් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් සිදුකරන, එවන් ක්‍රියාවක් සිදු කිරීමට උපකාර කරන හෝ එවන් ක්‍රියාවක් උග්‍ර තත්වයට පත් කෙරෙන ඕනෑම ක්‍රියාවක්' වශයෙනි.[1] මෙම නව නමුත්

[1] කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු, කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි මාර්ගගත හිංසනයන්ට හේතු සහ එහි ප්‍රතිවිපාක, කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, මානව හිමිකම්

වේගයෙන් ඉස්මතු වන සංකල්පය ගෝලීය වශයෙන් කාන්තාවන් විශාල පිරිසකට බලපාන අතර, ශ්‍රී ලංකාවේ ද මාර්ගගත ලිංගික හිංසනය ඉහල යමින් පවතී.[2]

දේශීය වශයෙන් ගත් කල, මෙරට ජනගහනයෙන් විශාල ප්‍රතිශතයක් අන්තර්ජාලය භාවිතා කරන අතර සංඛ්‍යාංක හෙවත් ඩිජිටල් සාක්ෂරතා අනුපාතය (එනම් පරිගණකයක්, ලැප්ටොප් පරිගණකයක්, ටැබ්ලටයක් හෝ ස්මාර්ට් ජංගම දුරකතනයක් තනිවම භාවිතා කළ හැකි ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රතිශතය) සහ පරිගණක සාක්ෂරතා අනුපාතය (එනම් ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රතිශතය තනිවම පරිගණකයක් භාවිතා කළ හැකිය) ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. සංඛ්‍යාංක හෙවත් ඩිජිටල් සාක්ෂරතා අනුපාතය පරිගණක සාක්ෂරතා අනුපාතයට වඩා ඉහළ තත්වයක පවතින අතර එහිදී ස්මාර්ට් ෆෝන් සහ ටැබ්ලට් පරිගණක භාවිතය සඳහා වැඩි නැඹුරුතාවයක් පිළිබිඹු කෙරේ. වර්ෂ 2016 දී ඩිජිටල් සාක්ෂරතා අනුපාතය ගණනය කිරීම මුලින්ම ආරම්භ කල විට එය ආසන්න වශයෙන් 33.8%[3] ක් වූ අතර එය වර්ෂ 2019 දී 46.0% දක්වා වර්ධනය විය.[4] ඊට සාපේක්ෂව ගත්කල, වර්ෂ 2016 දී දළ වශයෙන් 27.6% ක් වූ පරිගණක සාක්ෂරතා අනුපාතය  වර්ෂ 2019 දී 30.8% දක්වා වර්ධනය විය (එය 2014 දී 25.1% ක් සහ 2006/7 දී 16.1% ක් පමණි).[5]

අන්තර්ජාලය ඉතා වැදගත් සම්පතක් වන අතර කාන්තාවන්ට ඔවුන්ගේ කුසලතා වැඩිදියුණු කිරීමට සහ ඔවුන්ගේ ජීවිත හා ආර්ථික හා සමාජීය ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට ඔවුන් විසින් එය භාවිතා කිරීම වැදගත් වේ.[6] අන්තර්ජාලය කාන්තාවන්ගේ ජීවිත වැඩිදියුණු කිරීමට සහ ඔවුන් සවිබල ගැන්වීමට ප්‍රබල මෙවලමක් විය හැකි අතර, ඒ වෙනුවට එය ඔවුන්ට එරෙහිව ඔවුන්ව ඉලක්ක කරගත් මෙවලමක් බවට පත් නොවිය යුතු අතර එමඟින් ඔවුන්ගේ ආරක්ෂාව, ගෞරවය හෝ පෞද්ගලිකත්වය උල්ලංඝනය නොවිය යුතු ය.

සමානාත්මතාවය, ශාරීරික ස්වාධිපත්‍යය සහ ස්ත්‍රී පුරුෂ භාවය අතර වෙනස් කොට නොසැලකීම යන මූලධර්මයන්ට අනුකූල වන පරිදි කටයුතු කිරීමට නම්, ශ්‍රී ලංකාවෙහි ක්‍රියාත්මකව පවතින යල්පැනගිය අපරාධ නීතියට ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය වන අතර, මිනිසුන්ගේ ජීවිත කෙරෙහි වඩාත් ඉහල

දෘෂ්ටිකෝණයකින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි මාර්ගගත ප්‍රචණ්ඩත්වයට හේතු සහ එහි ප්‍රතිවිපාක, මානව හිමිකම් කවුන්සිලය, තිස්අටවන සැසිය, 2018 ජූනි 18 සිට 6 ජූලි දක්වා, 23 වන ඡේදය. https://www.ohchr.org/EN/HRBodies/HRC/RegularSessions/Session38/Documents/A_HRC_38_47_EN.docx

[2] චන්ද්‍රිකා ගදීවාසම්, 'ශ්‍රී ලංකාවේ කාන්තාවන් යුක්තිය සඳහා ප්‍රවේශයː සත්‍ය වින්-වින් කතාවක්', ඩේලි එෆ්ටී, 2019 මාර්තු 30, ලබා ගත හැකියː http://www.ft.lk/other-sectors/Access-to-justice-for-women-in-Sri-Lanka-A-true-WIN-WIN-story/57-675605

[3] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව, 'පරිගණක සාක්ෂරතා සංඛ්‍යාලේඛන - 2016 (වාර්ෂික)', 2016 http://www.statistics.gov.lk/ComputerLiteracy/StaticalInformation/Bulletins/2016-Annual

[4] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව, 'පරිගණක සාක්ෂරතා සංඛ්‍යාලේඛන - 2019 (වාර්ෂික)', 2019, ලබා ගත හැකියː http://www.statistics.gov.lk/ComputerLiteracy/StaticalInformation/Bulletins/2019-Annual  පිරිමින් අතර ඩිජිටල් සාක්ෂරතාවය 49.7% ක් වන අතර කාන්තාවන් අතර 42.6% කි. තවද, වයස අවුරුදු 15-19, අවුරුදු 20-24 සහ අවුරුදු 25-29 අතර ඩිජිටල් සාක්ෂරතාවය පිළිවෙලින් 77.8%, 78.6% සහ 73.4% වේ.

[5] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව, පරිගණක සාක්ෂරතා සංඛ්‍යාලේඛන - 2014 (වාර්ෂික)' 2014 http://www.statistics.gov.lk/ComputerLiteracy/StaticalInformation/Bulletins/2014-Annual

[6] ඩිජිටල් සාක්ෂරතාවයෙන් යුත් පිරිමින්ගේ අනුපාතය ඩිජිටල් සාක්ෂරතාවයෙන් යුත් කාන්තාවන්ගේ (42.6%) අනුපාතයට වඩා 7% (49.7%) වැඩි ය; ඉහත එම, පරිගණක සාක්ෂරතා සංඛ්‍යාලේඛන - 2019 (වාර්ෂික)

බලපෑමක් පෙන්නුම් කෙරෙන තාක්ෂණයේ ඉදිරිගමන හා දියුණුව සම්බන්ධයෙන් නිසි පරිදි ක්‍රියා කිරීම උදෙසා නීති ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය දැඩිව පවතී.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය බලාත්මක වූ වකවානුවෙහි, අද අප අත්දකින තාක්ෂණය පිළිබඳ තත්වයක් අදහාගත නොහැකි තරම් තත්වයක පැවතුණි. දණ්ඩ නීති සංග්‍රහයට සැලකිය යුතු අන්දමක සංශෝධනයක් අවසාන වරට සිදු වූයේ වර්ෂ 1998[7] සහ 1995[8] දී වන අතර (2006 දී සිදු වූ තවත් සුළු සංශෝධන කිහිපයක් ද සමග)[9], එවකට අන්තර්ජාලය බෙහෙවින් වෙනස් වූ අතර එකල ස්මාර්ට්ෆෝන් නොතිබුණි. අන්තර්ජාලය හරහා සිදුවන විවිධ ආකාරයේ ලිංගික හිරිහැරයන්ට මිනිසුන් මුහුණ දෙන අතර[10], කාලය හා තාක්ෂණය පරිණාමය වන විට, මේ අන්දමේ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකිරීමේ නව හා වෙනස් ක්‍රම ඉස්මතු වනු ඇත.

## මාර්ගගතව හා සාම්ප්‍රදායිකව ලිංගික හිංසනය සිදුවන ස්වභාවයන්ගේ වෙනස

මාර්ගගත ක්‍රම හරහා සිදු කරන ලද බොහෝ වැරදි වූ කලී එවන් වැරදි සාම්ප්‍රදායික ස්වරූපයන්ට අනුව සිදුවන අපරාධවලට සමාන තත්වයක් පෙන්නුම් කරනු ලබන අතර ඒවා සිදු කරනු ලබන්නේ වෙනත් මාධ්‍යයක් භාවිත කරමින් බව පමණක් විද්‍යමාන වේ. නිදර්ශනයක් වශයෙන් ගත් කල, සොරකම් කිරීමේ ක්‍රියාව භෞතිකව සිදු කළත් (මුදල් පසුම්බිය සොරා ගැනීම වැනි) හෝ මාර්ගගත ආකාරයක් හරහා (එනම් පිළිගත් සමාගම් මඟින් යොමු කරනු ලබන ආකාරයෙන් පුද්ගලයන්ගේ බැංකු ගිණුම් හෝ මුරපද ආදිය සොරා ගැනීම සඳහා විද්‍යුත් තැපැල් පණිවුඩ යැවීම වැනි) සිදු කළත් එය සොරකමක් වශයෙන් හඳුනාගනු ලැබේ. කෙසේ වෙතත්, මෙම මාර්ගගත මාධ්‍යයන් හරහා විශේෂයෙන් ලිංගික හිංසනයට අදාළව සිදුකරන වැරදි අතර සැලකිය යුතු වෙනස්කම් ගණනාවක් තිබේ.

මෙම වෙනස්කම් අතර පළමුවැන්න නම්, අපරාධකරුවන්ට ඔවුන් භූගෝලීය වශයෙන් (භෞතික) සීමාවන් මඟින් සීමා වී නොමැති නිසාවෙන් ඉතා පහසුවෙන් වින්දිතයින් වෙත අන්තර්ජාලය හරහා ප්‍රවේශ වීමේ හැකියාව පැවතීමයි.[11] අන්තර්ජාලය හරහා ලිංගික හිරිහැර සිදු කරන විට, එකී ක්‍රියාවන් ඒ ඒ රටවල භූමි සීමාවන් ඉක්මවා යා හැකි අතර, එවැනි අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරීමේදී අධිකරණ බලය පිළිබඳ ගැටළු පවා ඇති විය හැකිය.

දෙවනුව, යම් වරදක් සිදු කරන වැරදිකරුවන් අන්තර්ජාලය තුළ ක්‍රියාත්මක වන විට තෙවන පාර්ශවයන් බොහොමයක් වෙත පහසුවෙන් ළඟා වීමේ හැකියාව ඇති අතර එමඟින් වින්දිතයාගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය වන වැරදි වලින් සිදුවන හානිය තවත් උග්‍ර තත්වයකට පත් වියහැකිය.[12]

---

7 ලබා ගත හැකිය: https://www.lawnet.gov.lk/penal-code-amendment-6/

8 ලබා ගත හැකිය: https://www.lawnet.gov.lk/penal-code-amendment-5/

9 ලබා ගත හැකිය: https://www.lawnet.gov.lk/penal-code-amendment-8/

10 සචිනි පෙරේරා සහ රයිසා වික්‍රමතුංග, 'අදහස්, Btch: ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි තාක්ෂණය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය', ග්‍රවුන්ඩ් වීව්ස්, 2019 ජූනි https://groundviews.org/2019/06/27/opinions-btch-technology-based-violenceagainst-women-in-sri-lanka/ සහ https://drive.google.com/file/d/16ohQ7P2K08qz-kgiQUfSr0JCGvxDLHNR/view

11 නිකොලා හෙන්රි සහ ඇනස්ටේෂියා පවෙල්, 'එම්බෝඩිඩ් හාම්ස්: ස්ත්‍රී පුරුෂ භාවය, ලැජ්ජාව සහ තාක්ෂණය සයිබර් අවකාශයේ ලිංගික හිංසනය සඳහා පහසුකම් සපයයි', කාන්තාවන්ට එරෙහි හිංසනය, වෙළුම 21, අංක. 6, 2015 මාර්තු, 11 වන පිටුව, https://www.researchgate.net/profile/Anastasia_Powell/publication/274399083_Embodied_Harms/links/5601f11508ae_b30ba735582f.pdf

12 ඉහත එම.

එනම්, එක් මොහොතකින්, ඡායාරූපයක් දහස් ගණනක් සමග බෙදා ගත හැකි අතර, එවන් තත්වයකදී එය බාහිරට මුදාහැරුනු පසු නැවත ලබා ගැනීම හෝ සොයා ගැනීම අතිශයින් දුෂ්කර විය හැකිය.

අවසාන වශයෙන්, වැරදිකරුවන් බොහෝ විට නිර්නාමිකව සිටිමින් ස්වකීය අනන්‍යතාවය නිරාවරණය නොවන පරිදි කටයුතු කරන අතර, අන්තර්ජාලය හරහා විවිධ අනන්‍යතාවයන්ගෙන් පෙනී සිටී.[13] අන්තර්ජාලය තුළ නිර්නාමිකව සිටින අපරාධකරුවෙකු හඳුනා ගැනීම ඉතාමත් දුෂ්කර කාර්යයක් වන අතර ඒ සඳහා විශාල තාක්ෂණික කුසලතා සහ සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය විය හැකිය. විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණ නම්, 'මාළු බෑම හෙවත් - catfishing' ලෙස හඳුන්වනු ලබන සංසිද්ධිය, එනම්, යම් පුද්ගලයෙකු ව්‍යාජ අනන්‍යතාවයක් උපකල්පනය කිරීම සඳහා අන් අයව පොළඹවමින් සමාජ මාධ්‍ය භාවිතා කරන අතර එය බොහෝ විට තවත් කෙනෙකුට වංචා කිරීමට හෝ යමෙකු කුට උපක්‍රමයකට ලක් කිරීම අරමුණු කරගනිමින් සිදු වේ.[14]

ඉහතින් පෙන්වාදුන් වෙනස්කම් වලින් විද්‍යමාන කෙරෙනුයේ අන්තර්ජාලය හරහා සිදුවන ලිංගික හිංසනයන්ට එරෙහිව සටන් කිරීම සඳහා විශේෂිත නීති අවශ්‍ය බවත්; ඒවා හුදෙක් මෙම ක්‍රියාවන් සාපරාධී ක්‍රියා සංස්ථාපනය කරනු ලබන අන්දමේ නීති පමණක් නොව, මෙම වැරදි විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ වැළැක්වීම සඳහා අවශ්‍ය කාර්ය පටිපාටික විධිවිධාන ද ඇතුළත් නෛතික විධිවිධානයන් විය යුතු බවයි. සාම්ප්‍රදායික ලිංගික හිංසනයන්ට වැරදිකරුවන් වන තැනැත්තන් සඳහා දඬුවම් කිරීම උදෙසා පවතින නීති සමහර අවස්ථාවන්හි දී අන්තර්ජාලය හරහා සිදු කරනු ලබන ඒ හා සමාන අපරාධනීය ක්‍රියාවන් සිදු කරනු ලබන තැනැත්තන්ට දඬුවම් කිරීම දක්වා ද භාවිත කෙරෙන අතර, මෙය බොහෝ විට අධිකරණය විසින් ඒ සම්බන්ධයෙන් ලබා දිය හැකි අර්ථ නිරූපණය මත රඳා පවතී. මේ අනුව බලන කළ, පවතින ගැටළුකාරී තත්වයන් ආමන්ත්‍රණය කිරීම පිණිස සුදුසු පද්ධති ප්‍රතිසංස්කරණයන්ට අදාල නවීකරණයන් හා නිවැරදිකිරීම් අවශ්‍ය වේ.

තවද, මෙම වාර්තාවෙහි පහතින් සාකච්ඡා කරනු ලබන දැනට නීතියේ ඇති අඩුපාඩුකම් හේතුවෙන්, සාම්ප්‍රදායිකව සිදුවන ඇතැම් ලිංගික හිංසනයන් පවා නීතියේ විෂය පථයට අයත් නොවන අවස්ථා තිබේ.[15] මේ අනුව බලන කළ, වරද සිදුකිරීමට භාවිතා කරන මාධ්‍යයන් කවරේද යන්න නොසලකා යුක්තිය ඉටු කිරීම සහතික කිරීම සඳහා නීතිය යාවත්කාලීන කර ඇති බව සහතික කිරීම වැදගත් වේ.

## මාර්ගගත ලිංගික හිංසන සිදුවන ආකාරයන්

කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ විශේෂ වාර්තාකරු, කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි මාර්ගගත හිංසනය පිළිබඳ ස්වකීය වාර්තාවෙහි පෙන්වා දෙන ආකාරයට ගෝලීය වශයෙන් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි මාර්ගගත හිංසනයෙහි ස්වභාවයන් කිහිපයක් සම්බන්ධයෙන් විස්තරාත්මකව මාර්ගගත හිංසනයට අදාල හේතු සහ එහි ප්‍රතිවිපාක මානව හිමිකම් දෘෂ්ටි කෝණයකින් සඳහන් කර ඇත.[16] ස්ත්‍රීන් හා ගැහැණු ළමයින් මුහුණ දෙන මාර්ගගත

[13] ඉහත එම.

[14] ඕස්ට්‍රේලියාවේ ඊ-සේෆ්ටි කොමසාරිස්, 'කැට්ෆිෂිං', ලබා ගත හැක්කේ: https://www.esafety.gov.au/young-people/catfishing

[15] දර්ශාස්වාදය කොටස බලන්න.

[16] ඉහත එම, කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, මානව හිමිකම් දෘෂ්ටිකෝණයකින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි මාර්ගගත ප්‍රචණ්ඩත්වයට හේතු සහ එහි ප්‍රතිවිපාක, මානව හිමිකම් කවුන්සිලය, තිස් අටවන සැසිය.

ප්‍රචණ්ඩත්වයේ සමහර ආකාරයන් වශයෙන් මුදල්, ලිංගික ප්‍රතිලාභ හෝ ලිංගිකත්වය උද්දීපනය කරනු ලබන ස්වරූපයෙහි ඡායාරූප ලබා නොදෙන්නේ නම් කාන්තාවකගේ රහස්‍ය හෝ පුද්ගලික තොරතුරු ප්‍රසිද්ධ කරනු ලබන බවට තර්ජනය කිරීම, අනන්‍යතාවය සඟවමින් පළිගැනීමේ චේතනාවෙන් යමෙකුගේ රහස්‍ය හෝ පුද්ගලික තොරතුරු ප්‍රසිද්ධ කිරීම, චේතනාන්විතව යම් තැනැත්තෙකුට එරෙහිව විවාදාත්මක මතයක් ගොඩනැගීම සඳහා සමාජ මාධ්‍ය තුළ පණිවුඩ හෝ අදහස් ප්‍රකාශ කිරීම, නොහික්මුණු විලාසයකින් ප්‍රචණ්ඩකාරීව යමෙකු වටා මාර්ගගතව ජනයා රැස් කිරීම සහ හිරිහැර කිරීම, කාන්තාවකගේ අකමැත්තක් ඇති බව දැන දැනම යමෙකු මාර්ගගත ක්‍රම ඔස්සේ කාන්තාවක ලුහුබැඳීම හෝ සම්බන්ධකර ගැනීම, විශේෂයෙන්ම පුද්ගලයෙකු තමන්ගේ කලින් පෙම්වතියගේ හෝ ලිංගික සම්බන්ධතා පැවැත් වූ කාන්තාවකගේ ඡායාරූප හෝ වීඩියෝ ආදිය එවැනි කාන්තාවකගේ කැමැත්තට පටහැනිව අපහසුතාවයට පත්කිරීමේ අදහසින් මාර්ගගත ක්‍රම ඔස්සේ මුදාහැරීම ආදී වශයෙන් වූ ක්‍රියාවන් ගණනාවක් ඇය විසින් සිය වාර්තාවෙහි සඳහන් කර ඇත.[17] මෙම වැරදි වලට අමතරව, සයිබර් අවකාශය හරහා සිදුවන ලිංගික හිංසනයේ තවත් ආකාරයක් වන්නේ දර්ශාස්වාදය හෙවත් යමෙකු නිරුවත්ව සිටීම හෝ යම් ලිංගික ක්‍රියාවක යෙදෙමින් සිටීම නරඹමින් ලබන්නා වූ ලිංගික ආස්වාදයයි.

හරයාත්මකව බලන කල මෙම වැරදි බොහොමයක් මඟින් වින්දිතයාගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය කරයි. ළමා කාමුක දර්ශන නිර්මාණය කිරීම හෝ සන්තකයේ තබා ගැනීම වැනි ක්‍රියාවන්ට එරෙහිව නඩු පැවරීම සඳහා ශ්‍රී ලංකාව තුළ නීති පැවතියද, අන්තර්ජාලය හරහා සිදු කෙරෙන වෙනත් බොහෝ ලිංගික හිංසනයන්ට පිළියම් යෙදීම සඳහා සුදුසු නිශ්චිත නෛතික විධිවිධාන මෙරට තුළ නොමැත. මෙහිදී වඩාත්ම වැදගත් කරුණක් වන්නේ, ලිංගික හිංසනයන්ට ගොදුරු වූවන්ගේ ස්වාධීනත්වය සහ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා අතිශයින්ම වැදගත් වන අයිතිවාසිකමක් වන පෞද්ගලිකත්වයට ඇති අයිතියට ශ්‍රී ලංකාව තුළ ව්‍යවස්ථාමය පිළිගැනීමක් නොමැත.[18]

වර්ෂ 2015 දී ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව විසින් පුද්ගලිකත්වය විදහාපාන හෝ ලිංගිකත්ව නිරූපණය කෙරෙන ඡායාරූප ග්‍රහණය කර ගැනීම හෝ බෙදා හැරීම සම්බන්ධයෙන් වැරදි කිහිපයක් යෝජනා කරන ලද අතර එමඟින් දර්ශාස්වාදයට සහ යමෙකුගේ කැමැත්ත නොමැතිව යම් රහස්‍ය සම්බන්ධතාවයකට අදාල ඡායාරූප බෙදා හැරීම පිළිබඳ යම් යම් අංගයන් ආවරණය වීමේ හැකියාව පැවතුනි.[19] එම නිර්දේශයන්හි යම් යම් අඩුපාඩු පැවතියද, ඔවුන් පෙන්වා දෙනු බලන්නේ මෙම විෂය කරුණ සම්බන්ධයෙන් අදාල වන නීතිවල අවශ්‍යතාවය දැනටමත් ශ්‍රී ලංකාව තුළ හඳුනාගෙන ඇති බවයි. නීති කොමිෂන් සභාව විසින් පෙන්වාදෙන ලද නිර්දේශ කිසි විටෙකත් නීතියක් වශයෙන් සම්මත නොවූ අතර, මෙම වාර්තාව මගින් මෙම විෂය කරුණ සම්බන්ධයෙන් අවැසි නීති කඩිනමින් සම්මත කර ගැනීමට බල කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

---

17 ඉහත එම, 35-41 ඡේදයන්.

18 ශ්‍රී ලංකාවේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය', සාකච්ඡා පත්‍රය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය', 2020 සැප්තැම්බර්, https://www.cpalanka.org/wp-content/uploads/2020/09/Discussion-Paper-Right-to-Privacy-updated-draft-4-1.pdf

19 පුද්ගලිකත්වය උල්ලංඝනය කරන තත්වයන් යටතේ යෝජිත වැරදි බලන්න http://lawcom.gov.lk/web/images/stories/reports/2015/Proposed_Bill_Sections_1_2_3_4_and_5_Social_Media.pdf සහ පැහැදිලි කිරීමේ සටහන ලබා ගත හැකිය http://lawcom.gov.lk/web/images/stories/reports/2015/Explanatory_Comments_to_the_Proposed_Bill.pdf

# අ. මාර්ගගත දර්ශාස්වාදය

## දර්ශාස්වාදය යනු කුමක්ද?

දර්ශාස්වාදය යන්න අර්ථ දක්වා ඇත්තේ වෙනත් පුද්ගලයින් ලිංගිකව සිටින අවස්ථාවන්හිදී රහසිගතව එය නැරඹීමෙන් හෝ වඩාත් පොදු අර්ථයෙන් ගත් කල, වෙනත් පුද්ගලයින්ගේ පෞද්ගලික ජීවිතයෙහි කටයුතු නැරඹීමෙන් සතුටක් ලැබීමේ ක්‍රියාවක් වශයෙනි.[20] එක්තරා අවධියක දර්ශාස්වාකයින් විසින් යම් තැනැත්තෙකු තම නිවසේ හෝ වෙනත් පෞද්ගලික ස්ථානයක පෞද්ගලික ක්‍රියාවන්හි යෙදී සිටින තැනැත්තන්ව භෞතිකව නරඹන පිරිසක් (peeping toms) වශයෙන් සිටි අතර, තාක්ෂණයෙහි භාවිතය විසින් පටිගත කිරීමේ උපකරණ භාවිත කරමින් වින්දිතයන්ගේ කැමැත්තක් නොමැතිව ඔවුන්ගේ පුද්ගලික වීඩියෝ හෝ ඡායාරූප ලබා ගැනීමට හැකි පසුබිමක් නිර්මාණය වී ඇති තත්වයක් තුළ දර්ශාස්වාදයෙහි වෙනස්ම ස්වරූපයක තත්වයක් උද්ගතව තිබේ. මෙකී දර්ශාස්වාදය නම් තත්වය කාන්තාවන්ගේ සායක් යටින් ඡායාරූප ගැනීමේ සිට (commonly known as up-skirting) හෝ ඔවුන්ගේ හැට්ට හෙවත් බ්ලවුස් ඇතුළත[21] ඡායාරූප ගැනීම හෝ වින්දිතයින් පුද්ගලික ක්‍රියාවන්හි යෙදෙන ස්ථානවල වීඩියෝ උපකරණ ස්ථානගත කිරීම ආදී තත්වයන් දක්වා වූ පරාසයක සිදුවේ.

## පවත්නා නීතිය යටතේ එයට දඬුවම් කළ හැකිද?

දර්ශාස්වාදය යන වරද අන්තර්ජාලය හරහා හෝ සාමාන්‍යයෙන් භෞතිකව සිදු වුවද, එකී වරද සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ශ්‍රී ලංකාවෙහි අපරාධ නීතිය තුළ නිශ්චිත නෛතික විධිවිධාන නොමැත. එබැවින්, තාක්ෂණය භාවිත කරමින් සිදුකරන දර්ශාස්වාදය සම්බන්ධයෙන් වන ක්‍රියා පමණක් නොව, දර්ශාස්වාදය සම්බන්ධයෙන් වන සියලු ආකාරයේ ක්‍රියාවන් පිළිබඳව පියවර ගැනීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණයන් අවශ්‍ය වේ.

යම් තැනැත්තෙක් විසින් තවකෙකුව ශාරීරිකව නැරඹීම සඳහා එවන් කෙනෙකුගේ පරිශ්‍රයට ඇතුළු වී 'එබිකම් කිරීම' නම් ක්‍රියාව සිදු කරනු ලබන කෙනෙකු සම්බන්ධයෙන්, සාපරාධී අයුතු ඇතුළුවීම,[22] ගෙයකට අයුතු ඇතුළුවීම[23] හෝ සැඟවී සිට ගෙයකට අයුතු ඇතුළුවීම[24] යන චෝදනාවලට වරදකරුවන් විය හැකිය. කෙසේ වුවද, පුද්ගලයකු තම නිවෙස් හැර වෙනත් ස්ථානවල හෝ වින්දිතයින් ‍රැකියාවෙහි යෙදී සිටින විට වැසිකිළි හෝ ඇඳුම් මාරු කරන කාමර වැනි ස්ථානයන් වෙත එබිකම් කරනු ලබන අවස්ථා තිබිය හැකි අතර, එවැනි අවස්ථාවකදී, ඔවුන් වින්දිතයාගේ දේපළ තුළට සාපරාධී ඇතළුවීම යටතේ කටයුතු කිරීමට හැකි නොවනු ඇත. කෙසේ වෙතත්, අනවසරයෙන් ඇතුළුවීම දේපලවලට එරෙහි වරදක් මිස ලිංගික වරදක් නොවන අතර එවන් ක්‍රියාවක් සිදුකරන

---

20 බලන්නː කේම්බ්‍රිජ් ශබ්දකෝෂය, ලබා ගත හැකිය https://dictionary.cambridge.org/dictionary/english/voyeurism

21 වැලරි බෙල්, ක්‍රේග් හෙමන්ස් සහ බෙන්ජමින් ස්ටයිනර්, 'සාය වලට යටින් සහ බ්ලවුස් වලට පහළින්ː වීඩියෝ දර්ශාස්වාදයට ව්‍යවස්ථාදායක ප්‍රතිචාර පිළිබඳ ව්‍යවස්ථාපිත විශ්ලේෂණයක්', අපරාධ යුක්ති අධ්‍යයනය, වෙළුම. 19, අංක 3, 2006 සැප්තැම්බර්, 301-314 පි., 302 දී, ලබා ගත හැකිය https://www.researchgate.net/publication/240534560_Up_Skirts_and_Down_Blouses_A_Statutory_Analysis_of_Legislative_Responses_to_Video_Voyeurism

22 427 වන වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහය.

23 428 වන වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහය.

24 429 වන වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහය.

අපරාධකරුවෙකුට දඬුවම් කිරීම සඳහා සුදුසුම නීතිය මෙය නොවේ. ලිංගික අපරාධයක් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ගයන් ගැනීමේ දී එමගින් පුද්ගලයෙකුගේ ශාරීරික ස්වාධීනත්වය සහ ගෞරවය උල්ලඝණය කිරීමේ කාරණය ඉස්මතු වන අතර එය වින්දිතයාට වඩාත් බරපතල මට්ටමේ බලපෑමක් ඇති කරයි.

තවත් තැනැත්තෙකුගේ රහස්‍ය ඡායාරූප ගන්නා පුද්ගලයෙකුව වරදකරු කළ හැකි නීතිමය විධිවිධාන ඇත්තේ සීමිත ප්‍රමාණයකි. වින්දිතයාගේ වයස අවුරුදු 18 ට අඩු නම්, එවන් තැනැත්තෙකුගේ අශෝභන ඡායාරූපයක් ගැනීම හෝ ඡායාරූපයක් ගැනීම සඳහා සහය දැක්වීම, එය ඔවුන් සන්තකයේ තබා ගැනීම හෝ ප්‍රසිද්ධියට පත් කරන පුද්ගලයෙකු 'ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළ කිරීම්, ප්‍රදර්ශන ආදිය'[25] සම්බන්ධයෙන් වන වරදට වරදකරු විය හැකිය. මෙම විධිවිධාන වර්ෂ 1995 දී දණ්ඩ නීති සංග්‍රහය අන්තර්ගත කළ සංශෝධනය මගින් හඳුන්වා දුන් අතර එමගින් මෙකී වරද සඳහා අවම වශයෙන් වසර දෙකක සිර දඬුවමක් නියම කරන ලදි. එවැනි අවස්ථාවකදී, වින්දිතයාගේ කැමැත්ත අදාළ නොවේ.

වින්දිතයාගේ වයස කුමක් වුවත්, මෙම ක්‍රියාව සැබෑ ජීවිතයේ හෝ අන්තර්ජාලය හරහා සිදු කළත්, ලිංගික හිංසනය සිදුකරනු ලබන දර්ශාස්වාදකයෙකුව වරදකරුවෙකු කිරීමට ද හැකි මුත් ඒ සඳහා නීතිය පිළිබඳ පුළුල් අර්ථකථනයක් ලබා දීමේ අවශ්‍යතාව ඉස්මතු වේ. ඒ අනුව ගත්කල, (1) අඩන්තේට්ටම් කිරීමෙන් හෝ සාපරාධී බලහත්කාරය පෑමෙන් යම් තැනැත්තෙකුට ලිංගික අතවර කරන හෝ; (2) වචනයෙන් හෝ ක්‍රියාවෙන් යම් තැනැත්තෙකුට ලිංගික හිරිහැරයක් හෝ අතවරයක් සිදු කරන කවර හෝ තැනැත්තකු, ලිංගික අතවර කිරීමේ වරද සිදු කරන ලදැයි සැලකේ.[26] ඒ අනුව ඉහත සඳහන් කල දෙවන වරද යමෙකු විසින් සිදුකරයි නම් සහ එහිදී එකී ක්‍රියාව 'ලිංගික හිරිහැරයක් හෝ අතවරයක්' බවට අර්ථනිරූපණය කරනු ලබයි නම්, එහිදී, එවන් දර්ශාස්වාදකයෙකුට එරෙහිව නඩු පැවරීමට කටයුතු කල හැකිය. ලිංගික අතවර කිරීම සඳහා උපරිම දඬුවම වසර පහකි.

## දර්ශාස්වාදය සඳහා නෛතිකමය වශයෙන් ජාත්‍යන්තරව පවතින ප්‍රතිචාර

දර්ශාස්වාදය වූ කලී රටවල් කිහිපයකම ස්වකීය අපරාධ නීතියේ නිශ්චිත වරදක් වශයෙන් පෙන්වා දී ඇති ක්‍රියාවක් වන අතර ඒ ඒ රටවල් අදාල ප්‍රශ්නය විවිධාකාර ප්‍රවේශයන්ගෙන් ආමන්ත්‍රණය කරනු ලබයි. මාර්ගගත මාධ්‍යයන් ඔස්සේ සහ සාමාන්‍ය ලෝකය තුළ සිදුවන දර්ශාස්වාදය ආදී වශයෙන් වූ දෙආකාරයම සඳහා සමහර රටවල්හි එකී මූලික ක්‍රියාව තනි වරදක් වශයෙන් හඳුනාගෙන ඇති අතර එය තවත් සමහර රටවල් වල ඒ එක් එක් වරද සම්බන්ධයෙන් කටයුතු කිරීමට වෙන වෙනම නීති ඇත.

ස්කොට්ලන්තයේ වර්ෂ 2009 ලිංගික අපරාධ (ස්කොට්ලන්ත) පනතේ දර්ශාස්වාදය නම් වරද සම්බන්ධයෙන් අඩංගු නෛතික විධිවිධාන ඉතා සාධනීය මට්ටමක පවතින අතර එය පහතින් පෙන්වා දී ඇති පරිදි වේ:[27]

---

[25] 286අ (ඇ) වන වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහය.
[26] 345 වගන්තිය, වර්ෂ 1995 සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහය.
[27] 9 වන වගන්තිය, ලබා ගත හැකිය https://www.legislation.gov.uk/asp/2009/9/section/9

*9 වන වගන්තිය*

*(1) ඒ විසින් මෙහි (2) සිට (5) දක්වා වන උපවගන්තිවල සඳහන් කර ඇති ඕනෑම ක්‍රියාවක් කරන්නේ නම්, (''ඒ'') නම් තැනැත්තා දර්ශාස්වාදය නමින් හැඳින්වෙන වරදක් සිදු කරයි.*

*(2) පළමු කාරණය නම් ඒ —*

*(අ) වෙනත් පුද්ගලයෙකුගේ ("බී") එකඟතාවයකින් තොරව, සහ*

*(ආ) බී විසින් එකඟ වන බවට කිසිදු සාධාරණ විශ්වාසයකින් තොරව,*

*බී විසින් කරනු ලබන පෞද්ගලික ක්‍රියාවක් (6) වන උපවගන්තියේ සඳහන් අරමුණක් සඳහා නිරීක්ෂණය කරයි.*

*(3) දෙවන කාරණය නම් ඒ —*

*(අ) වෙනත් පුද්ගලයෙකුගේ ("බී") එකඟතාවයකින් තොරව, සහ*

*(ආ) බී විසින් එකඟ වන බවට කිසිදු සාධාරණ විශ්වාසයකින් තොරව,*

*බී විසින් කරනු ලබන පෞද්ගලික ක්‍රියාවක් (7) වන උපවගන්තියේ සඳහන් අරමුණක් සඳහා ඒ ට හෝ වෙනත් පුද්ගලයෙකුට ("සී") ට නිරීක්ෂණය කිරීමේ චේතනාව ඇතිව උපකරණ ක්‍රියාත්මක කරයි.*

*(4) තෙවන කාරණය නම් ඒ —*

*(අ) වෙනත් පුද්ගලයෙකුගේ ("බී") එකඟතාවයකින් තොරව, සහ*

*(ආ) බී විසින් එකඟ වන බවට කිසිදු සාධාරණ විශ්වාසයකින් තොරව,*

*බී විසින් කරනු ලබන පෞද්ගලික ක්‍රියාවක් (7) වන උපවගන්තියේ සඳහන් අරමුණක් සඳහා ඒ ට හෝ වෙනත් පුද්ගලයෙකුට ("සී") ට නැරඹීමේ චේතනාව ඇතිව පටිගත කිරීම කරයි.*

*(4අ) සිව්වන කාරණය නම් ඒ —*

*(අ) වෙනත් පුද්ගලයෙකුගේ ("බී") එකඟතාවයකින් තොරව, සහ*

*(ආ) බී විසින් එකඟ වන බවට කිසිදු සාධාරණ විශ්වාසයකින් තොරව,*

*(7) වන උපවගන්තියේ සඳහන් අරමුණක් සඳහා ඒ ට හෝ වෙනත් පුද්ගලයෙකුට ("සී") ට නිරීක්ෂණය කිරීමේ චේතනාව ඇතිව බී ගේ ලිංගික අවයව හෝ තට්ටම් හෝ යට ඇඳුම් වෙනත් ආකාරයකින් දර්ශනය නොවන තත්වයක දී බී ගේ ඇඳුම් වලට යටින් බී ගේ ලිංගික අවයව හෝ තට්ටම් (නිරාවරණය වී හෝ යට ඇඳුම් මඟින් ආවරණය වී තිබුන ද නොතිබුන ද) හෝ බී ගේ ලිංගික අවයව හෝ තට්ටම් ආවරණය කර ඇති යට ඇඳුම් නිරීක්ෂණය කිරීමට ඒ විසින් උපකරණ ක්‍රියාත්මක කරයි.*

*(4ආ) පස්වන කාරණය නම් ඒ —*

*(අ) වෙනත් පුද්ගලයෙකුගේ ("බී") එකඟතාවයකින් තොරව, සහ*

*(ආ) බී විසින් එකඟ වන බවට කිසිදු සාධාරණ විශ්වාසයකින් තොරව,*

*(7) වන උපවගන්තියේ සඳහන් අරමුණක් සඳහා ඒ ට හෝ වෙනත් පුද්ගලයෙකුට (සී") ට නිරීක්ෂණය කිරීමේ චේතනාව ඇතිව බී ගේ ලිංගික අවයව හෝ තට්ටම් හෝ යට ඇඳුම් වෙනත් ආකාරයකින් දර්ශනය නොවන තත්වයක දී බී ගේ ඇඳුම් වලට යටින් බී ගේ ලිංගික අවයව හෝ තට්ටම් (නිරාවරණය වී හෝ යට ඇඳුම් මඟින් ආවරණය වී තිබුන ද නොතිබුන ද) හෝ බී ගේ ලිංගික අවයව හෝ තට්ටම් ආවරණය කර ඇති යට ඇඳුම් නිරීක්ෂණය කිරීමට ඒ විසින් පටිගත කිරීම කරයි.*

*(5) හයවන කාරණය නම් ඒ —*

*(අ) උපකරණ ස්ථානගත කිරීම, හෝ*

*(ආ) (2), (3), (4), (4අ) හෝ (4ආ) හි සඳහන් යම් ක්‍රියාවක් කිරීමටඒ හෝ වෙනත් පුද්ගලයෙකුට ඉඩ සැලසීමේ අරමුණින් ව්‍යුහයක කොටසක් හෝ ව්‍යුහයක් සකස් කිරීම හෝ අනුගත කිරීම.*

*(6) (2) වන උපවගන්තියේ සඳහන් අරමුණු වන්නේ :*

*(අ) ලිංගික තෘප්තිය ලබා ගැනීම,*

*(ආ) බී ව නින්දිත, කරදරකාරී හෝ තැතිගන්වන සුළු තත්වයට පත් කරමින්.*

*(7) (3), (4), (4අ) සහ (4ආ) යන උපවගන්තිවල සඳහන් අරමුණු වන්නේ:*

*(අ) ලිංගික තෘප්තිය ලබා ගැනීම ( ඒ ට හෝ සී ට වේවා),*

*(ආ) බී ව නින්දිත, කරදරකාරී හෝ තැතිගන්වන සුළු තත්වයට පත්*

*කරමින්.*

මාර්ගගතව හෝ මාර්ගගත නොවන ආකාරයට සිදුකරනු ලබන අන්දමේ පුළුල් පරාසයක සිදුවීම් ස්කොට්ලන්ත නීතිය මඟින් ආවරණය කරනු ලබයි. මෙම වගන්තියෙහි පරමාර්ථය තුළට අන්තර්ගත වන දර්ශාස්වාදයෙහි මූලික වශයෙන් වර්ග ත්‍රිත්වයක් තිබේ:

- පුද්ගලික ක්‍රියාවක නිරත පුද්ගලයෙකු නැරඹීම / පටිගත කිරීම / උපකරණ ක්‍රියාත්මක කරමින් අදාල ක්‍රියාව නැරඹීම.
- පුද්ගලයෙකුගේ පුද්ගලික ශරීරය බැලීමට පටිගත කිරීම / උපකරණ ක්‍රියාත්මක කිරීම.
- ඉහත සඳහන් කිසිවක් කිරීමට උපකරණ ස්ථානගත කිරීම හෝ ව්‍යුහයක් වෙනස් කිරීම.

මෙම නීතිය යටතේ, යමෙකුට මෙම ක්‍රියාවෙන් ලිංගික තෘප්තියක් ලැබීම අවශ්‍ය නොවන අතර එවන් ක්‍රියාවක් වින්දිතයාට නින්දා කිරීම, කරදර කිරීම හෝ බිය ගැන්වීම සඳහා කළ විට පවා එමඟින් වරදක් සංස්ථාපනය වේ. මෙය මෙම වගන්තිය යටතේ අත්‍යවශ්‍ය නොවන අංගයක් වන අතර, වැරදිකරුට හෝ වෙනත් පුද්ගලයෙකුට යම් ලිංගික තෘප්තියක් ලැබී ඇති බව සනාථ කිරීම, එය ඔප්පු කිරීම අදාල චෝදනාව ගොනු කරනු ලබන පාර්ශවයට අභියෝගයක් විය හැකිය. ඒ කවර තත්වයකදී වුවද, සිදුවන විපත, නින්දාව හෝ අනතුරු ඇඟවීමද, යමෙකුට මෙම ක්‍රියාවෙන් ලිංගික තෘප්තිය ලැබීමේ අවස්ථාවක් හා සමානව වින්දිතයාට හානිකර විය හැකියි.

ඉන්දීය ව්‍යවස්ථාදායකය විසින් වර්ෂ 2013 අපරාධ නීතිය (සංශෝධන) පනත මගින් දර්ශාස්වාදය පිළිබඳ වරද හඳුන්වා දෙන ලද අතර නිර්භයා සිද්ධිය හෙවත් වර්ෂ 2012 දී දිල්ලියේ සිදු වූ කුරිරු සමූහ

ස්ත්‍රී දූෂණය සහ ඝාතනය සම්බන්ධව ඇති වූ ප්‍රකෝප වීමෙන් පසුව මෙම නීතිය බලාත්මක කරන ලද අතර එය ස්ත්‍රී දූෂණ විරෝධී පනත ලෙස ද හැඳින්වේ.[28] එකී වගන්තිය පහත පරිදි වේ:

> *354 සී. දර්ශාස්වාදය. " අදාල අපරාධකරු හෝ ඔහුගේ නියෝගය පරිදි කටයුතු කරනු ලබන වෙනත් තැනැත්තකු එවන් අවස්ථාවක දී එවැනි ක්‍රියාවක් සිදු නොකරනු ඇති බවට අදාල කාන්තාවට බලාපොරොත්තුවක් පවතින අවස්ථාවක යම් පිරිමි පුද්ගලයෙකු විසින් පෞද්ගලික ක්‍රියාවක යෙදෙන කාන්තාවකගේ රූපය නරඹන හෝ ඡායාරූපයක් ග්‍රහණය කරන්නේ නම් හෝ එවන් ඡායාරූප බෙදාහරිනු ලබන්නේ නම් එවන් ක්‍රියාවක් සිදු කරනු ලබන ඕනෑම තැනැත්තකු එකී පළමු වරද සඳහා වසරකට නොඅඩු, නමුත් වසර තුනක් දක්වා දීර්ඝ විය හැකි සිර දණ්ඩනයකට මෙන්ම දඩයකට යටත් විය යුත අතර, එකී වරදකාරීත්වයෙන් පසුව එකී ක්‍රියාව සඳහා දෙවන හෝ පසු අවස්ථාවකදී වරදකරු වූ විට වසර තුනකට නොඅඩු, නමුත් අවුරුදු හතක් දක්වා දීර්ඝ විය හැකි දණ්ඩනයකට මෙන්ම දඩයකට ද යටත් විය හැකිය.*
>
> *පැහැදිලි කිරීම 1. "මෙම වගන්තියෙහි අරමුණ සඳහා, "පුද්ගලික ක්‍රියාව" යන්නට ඇතුළත් වන්නේ, යම් අවස්ථාවක දී, පෞද්ගලිකත්වය සඳහා ඉඩප්‍රස්ථාව සැලසීමක් සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි ස්ථානයක සහ වින්දිතයාගේ ලිංගේන්ද්‍රිය, පසුපස හෝ පියයුරු නිරාවරණය වන හෝ එවන් ශරීර ස්ථාන යට ඇඳුම් වලින් පමණක් ආවරණය කර ඇති; හෝ වින්දිතයා වැසිකිළියක් භාවිතා කරනු ලබන විට; හෝ සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියේ නොකරන ආකාරයේ ලිංගික ක්‍රියාවක් වින්දිතයා විසින් කරන්නේ නම් එවැනි ක්‍රියාවක් නිරීක්ෂණ කිරීම සිදු කිරීම.*
>
> *පැහැදිලි කිරීම 2. - ඡායාරූප ලබා ගැනීමට හෝ කිසියම් ක්‍රියාවක් සඳහා වින්දිතයා එකඟ වන නමුත්, තෙවන පාර්ශවයන්ට ඒවා බෙදා හැරීමට එකඟ නොවන පසුබිමක, එවැනි රූපයක් හෝ ක්‍රියාවක් බෙදාහැරීම කරනු ලැබුවහොත්, එවැනි බෙදාහැරීමක් මෙම වගන්තිය යටතේ වරදක් ලෙස සලකනු ලැබේ.*

මෙම විධිවිධානය මගින් බැලූ බැල්මට එබිකම් කිරීම මෙන්ම අන්තර්ජාලය හරහා හෝ පටිගත කිරීමේ උපකරණ හරහා සිදුකරන ලද දර්ශාස්වාදය යන දෙආකාරයම ආවරණය වන අතර, වින්දිතයා පෞද්ගලික ක්‍රියාවක නිරත වීම සහ *"සාමාන්‍යයෙන් ඇය වැරදිකරු හෝ වෙනත් අයෙකු විසින් නිරීක්ෂණය නොකෙරේ යැයි අපේක්ෂා කළ හැකි තත්වයක්"* යන්නෙන් අදහස් කරන්නේ එකී වරද සිදුකිරීම වූ කලී පුද්ගලිකත්වය අපේක්ෂා කරන ස්ථානයක නිරීක්ෂණය කළ විට පමණක් යන්නට සීමා වන බවයි. මේ අනුව, සායවල් යටින් බැලීම හෝ ඡායාරූප ගැනීම වැනි ක්‍රියාවන් පොදු ස්ථානයක සිදුවිය හැකි බැවින් එවන්නක් මෙම වගන්තියෙහි ක්‍රියාව යන විෂය පථයට අයත් නොවිය හැකිය. ඒ අනුව බලන කල, ශ්‍රී ලංකාව තුළ දර්ශාස්වාදය නම් වරද ආවරණය වන සාපරාධී විධිවිධානයකට අදාල ස්ථානය සම්බන්ධයෙන් වඩාත් පුළුල් පරාසයක් ඇති කිරීම ඉතා වැදගත් ය.

---

[28] රිතුපර්ණ භට්ටාචාර්යා, 'අපරාධ නීතිය (සංශෝධන) පනත, 2013: එය පොදු ස්ථානවල කාන්තාවන්ගේ ආරක්ෂාව සහතික කරයිද?', ඉඩප්‍රස්ථාව හා සංස්කෘතිය, ඉන්දියාව 2013, 1: 1, පි. 13-27, පි 14, ලබා ගත හැකිය: https://www.researchgate.net/publication/260144553_Criminal_Law_Amendment_Act_2013_Will_it_ensure_women's_safety_in_public_spaces

ඉන්දියානු නීතිය "වින්දිතයාගේ ලිංගේන්ද්‍රයන්, පසුපස හෝ පියයුරු (නිරාවරණය වන හෝ යට ඇඳුම් වලින් පමණක් ආවරණය කර ඇති" යන්න සම්බන්ධයෙන් සඳහන් කර ඇති අතර අදාල ක්‍රියාව සම්බන්ධයෙන් සමහර අවස්ථා වලදී ස්කොට්ලන්ත නීතිය මඟින් "වින්දිතයින්ගේ ඇඳුම් යට (වින්දිතයින්ගේ) ලිංගික අවයව හෝ නිතඹ (යට ඇඳුම් සමග ආවරණය වී හෝ ආවරණය නොවී ඇති) හෝ (වින්දිතයින්ගේ) ලිංගික අවයව හෝ නිතඹ, යට ඇඳුම් වෙනත් ආකාරයකින් දර්ශනය නොවන අවස්ථාවක දී" වශයෙන් විධිවිධාන සලසා ඇත. මෙම විධිවිධාන ද්විත්වය මඟින්ම අදාල දර්ශාස්වාදය නම් වූ වරද සිදුවීමට නම් නිරීක්ෂණය කළ යුතු හෝ පටිගත කළ යුතු දෑ පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් ඉදිරිපත් කෙරේ.

කෙසේ වෙතත්, මේ ආකාරයෙන් පරිපූර්ණ ලැයිස්තුවක් ඇතුළත් කිරීම තුළින්ම එහි අඩුපාඩු ඇති බවක් විද්‍යමාන කෙරේ. 'පුද්ගලික' වීම යනු මනෝ මූලික කරුණක් වන අතර, සාමාන්‍යයෙන් කාන්තාවන් ඔවුන්ගේ ශරීරයේ සමහර කොටස් ආවරණය කිරීමට තෝරා ගන්නා අතර, ඔවුන්ගේ ශරීරයේ එම කොටස් නිරීක්ෂණය කළහොත් හෝ රහසිගතව ඡායාරූප ගත හෝ රූගත කරනු ලැබුවහොත් එවන් ක්‍රියාවක් යම් ආකාරයක උල්ලංඝනය කිරීමක් වන බවක් හැඟේ. නිදසුනක් වශයෙන්, තමන් පොදු ස්ථානයක සිටින විට තම දෙපා ආවරණය කරන මුස්ලිම් කාන්තාවක් ප්‍රසිද්ධියේ ඇගේ දෙපාවල රූප සංසරණය වුවහොත් එය උල්ලංඝනය කිරීමක් හෝ නින්දාවට ලක්වීමක් වශයෙන් හැඟී යා හැකිය. එම කාන්තාවට නින්දාවක් හෝ ලැජ්ජාවක් ඇතිවිය හැකි බව දැනුවත්ව එම රූප සංසරණය කළ පුද්ගලයෙකුට නඩු පැවරනු ලැබීමෙන් නිදහස් වීමට ඉඩක් නොලැබිය යුතුය. තවද, ශරීර කොටස්වල (පාද හෝ අත් වැනි) රූප හෝ පටිගත කිරීම් සාමාන්‍යයෙන් 'පුද්ගලික' (පාද හෝ අත් වැනි) ලෙස නොසැලකූ අවස්ථා තිබිය හැකි නමුදු, මෙම රූප භාවිතා කරන ආකාරය හේතුවෙන් නිදසුනක් වශයෙන්, විකෘති ලිංගික ආශාවන් සහිත තැනැත්තන් අතර සංසරණය කිරීමෙන් වින්දිතයාට කරදර, නින්දාව හෝ අනතුරු ඇඟවීම ඇති කරයි.[29]

## ශ්‍රී ලංකාවේ දර්ශාස්වාදය නම් වූ වරදක් සංස්ථාපනය කිරීම සඳහා නිර්දේශ

දර්ශාස්වාදය පිළිබඳ සාපරාධී වරදක් හඳුන්වා දිය යුතු අතර එමඟින්:

- වින්දිතයාගේ හෝ අපරාධකරුගේ ලිංගභේදය සඳහන් නොකිරීම. ඕනෑම කෙනෙකුට ලිංගික අපරාධවල ගොදුරක් හෝ අපරාධකරුවෙකු විය හැකි බව පිළිගත යුතුය.

- අපරාධකරුට අදාල පහතින් සඳහන් අවස්ථා ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් තරම් පුළුල් වීම:

    i. පුද්ගලික ක්‍රියාවක යෙදී සිටින විට හෝ පෞද්ගලිකත්වය පිළිබඳ සාධාරණ අපේක්ෂාවක් ඇති අවස්ථාවකදී පුද්ගලයෙකු භෞතික වශයෙන් බලා සිටී.

[29] 'පුද්ගලයෙකු ස්විට්සර්ලන්තයේ කාන්තාවන්ගේ පාද රහසිගතව රූගත කිරීම සහ අසභ්‍ය වෙබ් අඩවි වල වීඩියෝ පළ කිරීම', ස්වාධීන, 2016 සැප්තැම්බර් 16, ලබා ගත හැකිය https://www.independent.co.uk/news/world/europe/man-secretly-filming-women-s-feet-switzerland-churposting-them-porn-sites-a7311401.html

ii. පුද්ගලික ක්‍රියාවක යෙදී සිටින විට හෝ පෞද්ගලිකත්වය පිළිබඳ සාධාරණ අපේක්ෂාවක් ඇති තත්වයකදී, පුද්ගලයෙකුව ඡායාරූපගත කිරීමට හෝ පටිගත කිරීමට ඕනෑම උපකරණයක් භාවිතා කරයි නම් සහ එය ඔවුන්ගේම නැරඹීම / බැලීම සඳහා හෝ වෙනත් පුද්ගලයෙකුට නැරඹීම / බැලීම සඳහා හෝ ඒ දෙආකාරයම සඳහා වන අවස්ථාවක.

iii. යම් පුද්ගලයෙකුගේ පොදු හෝ පෞද්ගලික ක්‍රියාවක දී තමන් විසින් පුද්ගලික යැයි සාධාරණව සලකනු ලබන ශරීර කොටස් පටිගත කිරීමට හෝ ඡායාරූප ග්‍රහණය කර ගැනීමට ඕනෑම උපකරණයක් භාවිතා කරයි නම් සහ එය තමන්ගේ නැරඹීම / බැලීම සඳහා හෝ වෙනත් පුද්ගලයෙකුට නැරඹීමට / බැලීමට හෝ ඒ දෙආකාරයම සඳහා වන අවස්ථාවක.

iv. පුද්ගලික ක්‍රියාවක යෙදී සිටින විට හෝ පුද්ගලිකත්වය පිළිබඳ සාධාරණ අපේක්ෂාවක් ඇති තත්වයකදී, වින්දිතයකුව නැරඹීමට, පටිගත කිරීමට හෝ ඡායාරූප ලබාගැනීමට කිසියම් ව්‍යුහයකට, වාහනයකට හෝ ගොඩනැගිල්ලකට වෙනස්ම් සිදු කරයි නම් හෝ උපකරණ සවි කරයි නම් සහ එය තමන්ගේම නැරඹීම සඳහා / බැලීම, හෝ වෙනත් පුද්ගලයෙකුට නැරඹීමට / බැලීමට හෝ ඒ දෙආකාරයම සඳහා වන අවස්ථාවක.

v. යම් පුද්ගලයකුගේ පොදු හෝ පෞද්ගලික ක්‍රියාවක දී තමන් විසින් පුද්ගලික යැයි සාධාරණව සලකනු ලබන ශරීර කොටස් පටිගත කිරීමට හෝ ඡායාරූප ග්‍රහණය කර ගැනීමට කිසියම් ව්‍යුහයකට, වාහනයකට හෝ ගොඩනැගිල්ලකට වෙනස්කම් සිදු කරයි නම් සහ එය තමන්ගේම නැරඹීම සඳහා / බැලීම, හෝ වෙනත් පුද්ගලයෙකුට නැරඹීමට / බැලීමට හෝ ඒ දෙආකාරයම සඳහා වන අවස්ථාවක.

- වැරදිකරුට හෝ වෙනත් පුද්ගලයෙකුට අදාල ක්‍රියාවට වැරදිකරුවෙකු වීම සඳහා කිසියම් ලිංගික තෘප්තියක් ලැබුණු බව ඔප්පු කිරීම අත්‍යවශ්‍ය නොවේ. මෙම ක්‍රියාව සිදු කරනු ලැබුවේ වින්දිතයාව අවමානයට, පීඩාවට හෝ තැතිගැන්මට ලක් කිරීමට හෝ එසේ කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් එවන් බලපෑමක් ඇති බව පෙන්වීම ප්‍රමාණවත් විය යුතුය.

- වරද සිදු කිරීම සඳහා ඡායාරූප හෝ පටිගත කිරීම් ලබාගතයුතු ශරීර කොටස්වල පරිපූර්ණ ලැයිස්තුවක් අඩංගු නොවේ. ඒ වෙනුවට, "ලිංගේන්ද්‍රියන්, ශරීරයෙහි පශ්චාත් කොටස් හෝ පියයුරු නිරාවරණය වී ඇති හෝ යට ඇඳුම් වලින් පමණක් ආවරණය වී ඇති හෝ එම පුද්ගලයාගේ පෞද්ගලික යැයි සාධාරණ ලෙස සැලකිය හැකි වෙනත් ශරීර කොටසක් වැනි, හෝ එම පුද්ගලයා පෞද්ගලිකව සලකනු ලැබේ යැයි දන්නා" ආදී වශයෙන් වූ පරිපූර්ණ නොවන විස්තරයක් ඇතුළත් කළ හැකිය.

- ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයෙන් දැනටමත් අවම දඬුවම් නියම කර ඇති වෙනත් ලිංගික අපරාධ කිහිපයකට සමාන අන්දමට මෙම වරද සඳහා ද අවම දඬුවමක් ඇතුළත් කළ

හැකිය.[30] කෙසේ වෙතත්, අවම දඬුවම සාධාරණ ලෙස සැහැල්ලු විය යුතු වන්නේ අදාල වරදට දැඩි දඬුවමක් අවශ්‍ය නොවන අවස්ථා තිබිය හැකි නිසාවෙනි.

- වැරදිකරුවාට දීර්ඝ දඬුවමක් ලබා දෙන බරපතල තත්වයන් ඇතුළත් විය හැකිය. විශේෂයෙන්ම වින්දිතයා බාල වයස්කරුවෙකු නම්, වැරදිකරු විසින් ගන්නා ලද ඡායාරූප / වීඩියෝ සංසරණය කර හෝ ප්‍රකාශයට පත් කර ඇත්නම්; වැරදිකරු අදාල ඡායාරූප හෝ වීඩියෝ වලින් ලාභයක් ලබා ඇත්නම්; හෝ අදාල වැරදිකරු නැවත එම ක්‍රියාවම සිදු කරන ලද වැරදිකරුවෙකු නම් යනාදී අවස්ථාවන් මේ සඳහා අන්තර්ගත වේ.

- වින්දිතයාට වන්දි ගෙවීම සඳහා විධිවිධාන සැලසිය යුතුය.[31]

---

30 උදාහරණය - ස්ත්‍රී දූෂණය - 363 සහ 364 වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහය; ව්‍යභිචාරය - 364 අ වගන්තිය; බරපතල ලිංගික අපයෝජනය - 365 ආ වගන්තිය

31 දණ්ඩ නීති සංග්‍රහයේ දැනටමත් ලිංගික හිංසනය (445 වගන්තිය) වැනි ලිංගික අපරාධ කිහිපයක් සම්බන්ධයෙන්; ස්ත්‍රී දූෂණය (363 සහ 364 වගන්ති); ව්‍යභිචාරය (364 අ වගන්තිය); අස්වාභාවික වැරදි (365 වගන්තිය); සහ බරපතල ලිංගික අපයෝජනය (365 ආ වගන්තිය).

## ආ. රහස්‍ය ඡායාරූප හෝ වීඩියෝ එකඟතාවයකින් තොරව බෙදා හැරීම

### රහස්‍ය ඡායාරූප හෝ වීඩියෝ එකඟතාවයෙන් තොරව බෙදා හැරීම යනු කුමක්ද?

රහස්‍ය රූප හෝ වීඩියෝ එකඟතාවයකින් තොරව බෙදා හැරීම යනු රූප මත පදනම් වූ ලිංගික අපයෝජනයක් වන අතර එය සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ එකඟතාවයකින් තොර අසභ්‍ය දර්ශන හෝ 'පළිගැනීමේ අසභ්‍ය' දර්ශන වශයෙනි.[32] එය කාන්තාවන්ට එරෙහි හිංසනය, එහි හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ විශේෂ වාර්තාකරු විසින් නිර්වචනය කර ඇත ආකාරයට, *"වින්දිතයාට ලැජ්ජාව, අපකීර්තිය හෝ හානියක් කිරීමේ අරමුණින් කැමැත්ත සහිතව හෝ රහිතව ලබාගත් රහස්‍ය රූප මාර්ගගත ක්‍රමවේද හරහා ප්‍රසිද්ධියට පත් කිරීම"* සම්බන්ධ ක්‍රියාවකි.[33]

වර්තමානයෙහි අප දන්නා පරිදි අන්තර්ජාල යුගයට පෙර වකවානුවෙහි, සාමාන්‍යයෙන් රහස්‍ය රූප හෝ වීඩියෝ බෙදා හැරීම බෙහෙවින් වෙනස් ස්වරූපයක් ගත් අතර එවන් ක්‍රියාවක් සාමාන්‍යයෙන් එවකට විශාල ප්‍රේක්ෂක සංඛ්‍යාවක් වෙත ළඟා නොවනු ඇත. කෙසේ වෙතත්, වර්තමාන තත්වය අනුව ගත් කල, එක් ක්ෂණයකින් බොත්තමක් ක්ලික් කිරීමෙන්, රහස්‍ය රූප හෝ වීඩියෝ මුළු ලෝකය සමඟම බෙදා ගත හැකි අතර, ඒවා මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ප්‍රකාශයට පත් කළ පසු, සැබවින්ම ඒවායෙහි බෙදා හැරීම සම්පූර්ණයෙන්ම නතර කළ නොහැකිය. මෙම තත්වය බොහෝ විට වර්තමානයෙහි සිදුවන අතර එය දැන් ජනප්‍රිය අසභ්‍ය දර්ශන ප්‍රභේදයක් වන්නා සේම එකඟතාවයකින් තොරව බෙදා හරින ලද වීඩියෝ සහ කිසිදු එකඟතාවයකින් තොරව පටිගත කර ඇති බවක් පෙනෙන්නට ඇති වීඩියෝ පට යන දෙආකාරයෙහිම අසභ්‍ය දර්ශන බොහෝ අසභ්‍ය වෙබ් අඩවි වල දක්නට ලැබේ.[34] ඇත්ත වශයෙන්ම, අසභ්‍ය දර්ශන නරඹනු ලබන ශ්‍රී ලාංකිකයන් අතර වැඩිපුරම නරඹන ලද අසභ්‍ය දර්ශන කාණ්ඩය වන්නේ නිවෙස් වල සිදුකරන ලද අසභ්‍ය වීඩියෝවල කාන්තාවන්ගේ වීඩියෝ පට බව වාර්තා වේ.[35]

වර්තමානයෙහි පවතින දියුණු තාක්ෂණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් අදාල පටිගත කිරීම්වල වේගය, ඒවායෙහි ළඟාවීම සහ හඳුනාගත නොහැකි වීම මඟින් වින්දිතයින් මුහුණ දෙන පීඩාව තවදුරටත් උග්‍ර තත්වයකට පත් කරනු ලබයි. මේ ආකාරයෙන් සිදුවන විපතට, නින්දා අපහාස ඇතුළත් විය හැකි අතර, වින්දිතයාව සම්බන්ධ කරගත හැකි තොරතුරු ද සමඟ රහස්‍ය ඡායාරූප සහ වීඩියෝ මුදා

---

[32] කෙසේ වෙතත් සමහර විද්වතුන් 'පළිගැනීමේ අසභ්‍ය' යන යෙදුම භාවිතා කිරීමෙන් වැළකී සිටින්නේ පළිගැනීම හැර වෙනත් හේතූන් මත බෙදා හැරීම සිදු කළ හැකි නිසාත්, පළිගැනීම යන වචනයෙන් වින්දිතයාට දොස් පැවරීමේ අර්ථයන් ඇති නිසාත්, වින්දිතයා වරදකරුට කුපිත කිරීමේ බලපෑමක් ඇති කළ දෙයක් කළ බව අඟවන බැවිනි. බලන්න: මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය, ඇප 4, 'මොඩියුලය 12: අන්තර් පුද්ගල සයිබර් අපරාධ', විශ්ව විද්‍යාල මොඩියුල මාලාව: සයිබර් අපරාධ, ලබා ගත හැකි ස්ථාන: https://www.unodc.org/e4j/en/cybercrime/module12/key-issues/gender-based-interpersonal-cybercrime.html

[33] ඉහත වාර්තාව, කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ, මානව හිමිකම් දෘෂ්ටිකෝණයකින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි මාර්ගගත ප්‍රචණ්ඩත්වයට හේතු සහ එහි ප්‍රතිවිපාක, මානව හිමිකම් කවුන්සිලය, තිස් අටවන සැසිය, 41 වන ඡේදය.

[34] මාර්තා ගවුඩ්ස්මිත්, 'පළිගැනීමේ අසභ්‍ය දර්ශන: සංකල්පමය විශ්ලේෂණයක් - හෙළිදරව් කිරීමේ අපරාධයක් නිරාවරණය කිරීම', ලීඩන් විශ්ව විද්‍යාලය, 2017. ලබා ගත හැකි: https://openaccess.leidenuniv.nl/bitstream/handle/1887/47472/20170127%20MG%20Revenge%20pornography%20a%20conceptual%20analysis_Redacted.pdf?sequence=4

[35] 'අමුතු අපරාධකරුවන් 800 ක්: ශ්‍රී ලංකාවේ කාමුක දර්ශන නැරඹීම', ඊන්පදදබද.කන, 2017 අප්‍රේල්, ලබා ගත හැකි ස්ථාන: http://www.bakamoono.lk/admin/wp-content/uploads/2017/04/800-Odd-Criminals-Watching-Porn-in-Sri-Lankabakamoono.lk_.pdf

හැරීමෙන් පසුව හෝ වින්දිතයා ප්‍රසිද්ධියේ දන්නා තැනැත්තකු වන අවස්ථාවක දී, අදාල ක්‍රියාව මඟින් වින්දිතයාට අතවර කිරීම ද ඇතුළත් වේ.

## පවත්නා නීතිය යටතේ එයට දඬුවම් කළ හැකිද?

වෙනත් තැනැත්තකුගේ රහස්‍ය රූප ප්‍රකාශයට පත් කරන හෝ එසේ කරන බවට තර්ජනය කරන පුද්ගලයෙකුට දඬුවම් කළ හැකි විධිවිධාන කිහිපයක් වර්තමානයේ දී ක්‍රියාත්මක වේ.

දණ්ඩ නීති සංග්‍රහයේ 345 වන වගන්තියේ ලිංගික අතවර කිරීම පිළිබඳ අර්ථ නිරූපණයට ලබා දී ඇති පුළුල් අර්ථකථනයකට අනුකූලව බලන කල, එකඟතාවයකින් තොරව රහස්‍ය රූප හෝ වීඩියෝ හුවමාරු කර ගැනීම මෙම වරදෙහි විෂය පථය තුළට අන්තර්ගත වන්නේ එමඟින් ලිංගික හිරිහැරයක් හෝ ලිංගික අතවරයක් උද්ගත වන නිසාවෙනි.

වින්දිතයාගේ වයස අවුරුදු දහඅටකට අඩු නම්, යම් අසභ්‍ය හෝ අශ්ශීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක පෙනී සිටීමට හෝ රඟපෑමට හෝ ඡායාරූපයක හෝ චිත්‍රපටයක රූගත කරනු ලැබීමට හෝ රහස්‍ය ඡායාරූප හෝ වීඩියෝ ගෙන්වා ගැනීමට උපකාර කරන, ඒ සඳහා කැමති කරවා ගන්නා, යොදවන, පොළඹවන හෝ බල කරන හෝ තම සන්තකයෙහි තබා ගැනීම පවා දණ්ඩනීති සංග්‍රහයෙහි 286අ වගන්තියේ විෂය පථයට අයත් වන අතර එකී වරදට අවම වශයෙන් වසර දෙකක සිර දඬුවමක් නියම වේ.

පළිගැනීමේ අරමුණින් සිදුකෙරෙන අසභ්‍ය ප්‍රකාශන බෙදා හැරීමේ වරදට ද වර්ෂ 1983 අංක 22 දරණ අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත යටතේ දඬුවම් ලබාදිය හැකි අතර, වෙනත් කරුණු අතර, අසභ්‍ය රූප බෙදා හැරීම හෝ ප්‍රසිද්ධ ප්‍රදර්ශනය සඳහා ළඟ තබා ගැනීම වරදක් බවට පත්කර තිබේ. කෙසේ වෙතත්, මෙය අහෝසි කළ යුතු දරුණු නීතියක් වන්නේ එය හුදෙක් සමහර තැනැත්තන් විසින් අශ්ශීල රූප බවට සැලකීමේ හැකියාවක් පවතින එහෙත් යම් තැනැත්තකු විසින් නිෂ්පාදනය කරන රූප, වීඩියෝ සහ ලියවිල හෝ එවැන්නකුගේ සන්තකයේ එවන් දෑ පැවතීම සම්බන්ධයෙන් (වෙළඳාම, බෙදා හැරීම හෝ ප්‍රසිද්ධ ප්‍රදර්ශනය සඳහා) දඬුවම් කිරීම සඳහා ද එකී නීතිය අවභාවිත කළ හැකි බැවිනි. මේ අනුව, මෙම රූප බෙදා ගැනීමේ අදහසින් (තමන් විසින්ම) පවා එකඟතාවයක් සහිතව ලබා ගන්නා පුද්ගලයෙකු පවා මෙම නීතියේ විෂය පථයට අයත් විය හැකිය. යමෙකු කලාව ලෙස සලකන යම් දෙයක් මෙම නීතිය යටතේ අසභ්‍ය යැයි සිතිය හැකි අතර එය වාරණය සඳහා මඟ පෑදෙන මෙවළමක් වීමේ හැකියාව ද පවතී.

## රහස්‍ය රූප හෝ වීඩියෝ එකඟතාවයකින් තොරව බෙදා හැරීම පිළිබඳ ජාත්‍යන්තර නෛතික ප්‍රතිචාර

වර්ෂ 2013 අපරාධ නීතිය (සංශෝධන) පනත හරහා පැමිණි ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයෙහි දර්ශාස්වාදය සම්බන්ධයෙන් පවතින විධිවිධානයන්ට අනුකූලව ගත්කල, රහස්‍ය රූප සහ වීඩියෝ කැමැත්තෙන් ලබාගෙන තිබුණද, එකඟතාවයකින් තොරව, එකී රහස්‍ය රූප හෝ වීඩියෝ බෙදාහරිනු ලබන අයට දඬුවම් කිරීම දක්වා එකී ප්‍රතිපාදනය පුළුල්ය.

දණ්ඩ නීති සංග්‍රහයේ 354 සී වගන්තියේ 2 වන පැහැදිලි කිරීම හරහා එය මෙසේ සඳහන් වේ.

> *වින්දිතයා රූප ග්‍රහණය කර ගැනීමට හෝ කිසියම් ක්‍රියාවක් කිරීමට එකඟ වන නමුත් ඒවා තෙවන පාර්ශවයක පුද්ගලයින්ට බෙදා හැරීමට එකඟත්වයක් ලබා දී නොමැති කල්හි, එවැනි රූපයක් හෝ ක්‍රියාවක් බෙදාහරිනු ලැබුවහොත්, එවන් ක්‍රියාවක් මෙම වගන්තිය යටතේ වරදක් ලෙස සලකනු ලැබේ.*

රහස්‍ය රූප හෝ වීඩියෝ එකඟත්වයකින් තොරව බෙදා හැරීමේ ක්‍රියාව දර්ශාස්වාදය නම් වරදට අදාල පැහැදිලි කිරීම යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වුවද, මෙම වරදවල් ද්විත්වය බොහෝ දුරට වෙනස් වැරදි වේ. රහස්‍ය රූප හෝ වීඩියෝ එකඟත්වයකින් තොරව බෙදා හැරීම නම් වූ තත්වයෙහි දී, වින්දිතයා ඡායාරූප ගැනීමට හෝ පටිගත කිරීමට එකඟ වූවාද යන්න සලකනු නොලබන අතර එහිදී වඩාත් අදාළ කාරණය වන්නේ බෙදාහැරීම යන ක්‍රියාවයි. පුද්ගලයෙකුට තිබිය හැකි පෞද්ගලිකත්වය සහ ඒ සම්බන්ධයෙන් ඇති අපේක්ෂාව උල්ලංඝනය කිරීම කේන්ද්‍රගත වී ඇති දර්ශාස්වාදයට වඩා මෙය වෙනස් ය. කෙසේ වෙතත්, එය වෙනත් වරදකට අදාල පැහැදිලි කිරීමක් වශයෙන් පමණක් ඇතුළත් කර තිබුනද, මෙම වරද ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයට අන්තර්ගත් කිරීම වූ කලී ප්‍රශංසනීය තත්වයකි.

වර්ෂ 2016 හි නින්දා සහගත චර්යා සහ ලිංගික හිංසන (ස්කොට්ලන්ත) පනතේ 2 සහ 3 වගන්තිවලින් පෙන්වාදෙන පරිදි:[36]

> *2. රහස්‍ය ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් අනාවරණය කිරීම හෝ අනාවරණය කරන බවට තර්ජනය කිරීම*
>
> *(1) පුද්ගලයෙකු ("ඒ") වරදක් කරන්නේ නම් -*
>
> *(අ) ඒ විසින් තවත් පුද්ගලයෙකු ("බී") රහස්‍ය තත්වයක සිටින අවස්ථාවක් බව පිළිබිඹු කරන හෝ පිළිබිඹු වන බව පෙනෙන ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් හෙළිදරව් කිරීම හෝ හෙළිදරව් කරන බවට තර්ජනය කිරීම කරනු ලබයි නම්,*
>
> *(ආ) ඒ විසින් එසේ කිරීමෙන්, බී ට බිය, අනතුරු ඇඟවීම හෝ පීඩාව ඇති කිරීමට අදහස් කරයි හෝ බී ට බිය, අනතුරු ඇඟවීම හෝ පීඩාව ඇති වේය යන කරුණ පිළිබඳව නොසැලකිලිමත් වේ නම්. සහ*
>
> *(ඇ) මීට පෙර බී හෝ බී ගේ කැමැත්ත සහිතව අදාල ඡායාරූපය හෝ චිත්‍රපටය මහජනයාට හෝ මහජනයාට හෙළි කර නොතිබීම.*
>
> *(2) මෙම වගන්තියෙහි අරමුණු සඳහා, ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් හෝ එවැන්නක් බවට පත් කිරීමට හැකියාව ඇති දත්ත හෝ වෙනයම් දෙයක් බී හැර වෙනත් පුද්ගලයෙකුට ලබා දී තිබේ නම්, පෙන්වනු ලැබ තිබේනම් හෝ ලබාගතහැකි තත්වයකට පත්කර තිබේනම්.*

*("ඒ") විසින් වරදක් සිදු කරන්නනේය.*

> *(3) (1) වන උපවගන්තිය යටතේ වරදක් සඳහා වන ක්‍රියාමාර්ගයේදී, පහත සඳහන් කරුණු කිසිවක් ස්ථාපිත කර ඇත්නම් ඒ සඳහා විත්තිවාචකයක් ඇත -*

---

[36] ලබා ගත හැකි ස්ථානඃ https://www.legislation.gov.uk/asp/2016/22/part/1/crossheading/disclosure-of-an-intimatephotograph-or-film/enacted

(අ) ඡායාරූපය හෝ චිත්‍රපටය අනාවරණය කිරීම සඳහා බී විසින් එකඟ වී තිබීම,

(ආ) ඡායාරූපය හෝ චිත්‍රපටය හෙළිදරව් කිරීමට බී විසින් එකඟ වූ බවට ඒ විසින් සාධාරණ ලෙස විශ්වාස කිරීම,

(ඇ) අපරාධ වැළැක්වීම, අනාවරණය කිරීම, විමර්ශනය කිරීම හෝ නඩු පැවරීම සඳහා ඡායාරූපය හෝ චිත්‍රපටය හෙළිදරව් කිරීම අත්‍යවශ්‍ය බව සාධාරණ ලෙස විශ්වාස කිරීම.

(ඈ) ඡායාරූපය හෝ චිත්‍රපටය හෙළිදරව් කිරීම පොදු මහජන යහපතට හේතු වන බවට ඒ විසින් සාධාරණ ලෙස විශ්වාස කිරීම.

(4) (3) වන උපවගන්තියේ අරමුණු සඳහා, අනාවරණය කරන ලද ඡායාරූපයට හෝ චිත්‍රපටයට ලබා දුන් එකඟත්වය වූ කලී -

(අ) නිශ්චිත අනාවරණය සඳහා විශේෂිත වූ එකඟතාවය හෝ (අදාල සිද්ධිමය තත්වය අනුව) තර්ජනයට ලක්වූ විශේෂිත අනාවරණය, හෝ

(ආ) අදාල නිශ්චිත අනාවරණය ද ඇතුළත් වන සාමාන්‍ය එකඟත්වයක් හෝ (අදාල සිද්ධිමය තත්වය අනුව) තර්ජනයට ලක්වූ විශේෂිත අනාවරණය වීම සම්බන්ධ එකඟතාවයක් විය හැකිය.

(5) (1) වන උපවගන්තිය යටතේ වරදක් සඳහා වන ක්‍රියා පටිපාටියේ දී, පහත සඳහන් කාරණය ස්ථාපිත වුවහොත් ඒ සඳහා විත්ති වාචකයක් ඇත -

(අ) ඡායාරූපයේ හෝ චිත්‍රපටයේ පෙන්වා ඇති රහස්‍ය තත්වය තුළ බී සිටීම,

(ආ) බී එකඟ නොවූ වෙනත් පුද්ගලයෙකුගේ හිතාමතා කළ ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස බී රහස්‍ය තත්වයක නොසිටියේය.

(ඇ) බී රහස්‍ය තත්වයක සිටියදී -

(i) යනු මහජනතාවට ප්‍රවේශ විය හැකි ස්ථානයක බී සිටීම (ගාස්තුවක් ගෙවුවද නොගෙවුවද), සහ

(ii) මහජනතාව එකී අවස්ථාවේ පැමිණ සිටීම.

(6) ඉහතින් සඳහන් අංගයන් ස්ථාපිත කරනු ලබන්නේ නම්, (3) වන උපවගන්තියේ අරමුණු සඳහා කරුණක් ස්ථාපිත කර ඇති අතර (5) වන උපවගන්තියේ අරමුණු සඳහා අදාල ප්‍රශ්ණය තහවුරු වේ.

(අ) එය එසේය යන්න පිළිබඳව ප්‍රශ්නයක් මතු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කරනු ලැබේ නම්, සහ

(ආ) පැමිණිල්ල විසින් එය එසේ නොවන බවට සාධාරණ සැකයකින් ඔබ්බට ඔප්පු නොවේ නම්.

(7) (1) වන උපවගන්තිය යටතේ වරදක් කරන පුද්ගලයෙකු.

(අ) ලඝු කාර්යය පිටිපාටිය මත වරදකරු වේ නම්, මාස 12 නොඉක්මවන කාලයක් සඳහා සිරගත කිරීම හෝ ව්‍යවස්ථාපිත උපරිමයට වඩා නොවැඩි දඩයක් (හෝ දෙආකාරයම),

*(ආ) අධිචෝදනා මත වරදකරු වේ නම්, වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා සිර දඬුවමක් හෝ දඩයක් (හෝ දෙආකාරයම) ලක්වේ.*

*3. 2 වන වගන්තියෙහි අර්ථ නිරූපණය*

*(1) 2 වන වගන්තියේ අරමුණු සඳහා, -*

*(අ) අදාල පුද්ගලයා පහත සඳහන් ක්‍රියාවක නිරත වීම, සහභාගී වීම හෝ පෙනී සිටීම.*

*(i) සාධාරණ පුද්ගලයෙකු විසින් එය ලිංගික ක්‍රියාවක් ලෙස සලකනු ලබන්නේ නම්, සහ*

*(ii) එය සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියේ කරනු නොලබන ක්‍රියාවක් නම්, හෝ*

*(ආ) පුද්ගලයාගේ ලිංගේන්ද්‍රියන්, නිතඹ හෝ පියයුරු නිරාවරණය වී හෝ යට ඇඳුම් වලින් පමණක් ආවරණය වී ඇත්නම් එහිදී පුද්ගලයෙකු "රහස්‍ය තත්වයක" සිටි බවට සැලකේ.*

*(2) 2 වන වගන්තියෙහි -*

*"චිත්‍රපටය" යන්නෙන් අදහස් කරන්නේ අදාල රූපය කිසියම් ආකාරයකින් වෙනස් කර තිබුණත් නැතත්, ඕනෑම ආකාරයකින් චලනය වන රූපයක්, එය මුලින් රූපගත කරගනු ලැබුවේ චලනය වන රූපයක් නිපදවිය හැකි ඕනෑම මාධ්‍යයකින් කරන ලද පටිගත කිරීමක් සහ එහි පිටපතක් ද ඇතුළත් ය.*

*"ඡායාරූපය" යන්නෙන් අදහස් කරන්නේ අදාල රූපය කිසියම් ආකාරයකින් වෙනස් කර තිබුණත් නැතත්, ඕනෑම ආකාරයකින් නිශ්චල ඡායාරූපයක්, එය මුලින් ඡායාරූපකරණය මඟින් ග්‍රහණය කර ගැනීමක් සහ රූපයේ පිටපතක් ඇතුළත් වේ.*

ඡායාරූපයෙහි ඇති රහස්‍ය ශරීර කොටස් සැබවින්ම වින්දිතයාගේ ඒවා නොවන විට, සකසනු ලැබූ හෝ 'ෆොටෝෂොප්' වැනි මෘදුකාංගයක් හරහා නිර්මාණය කරන ලද රූපයක් සංසරණය වන අවස්ථා ඉන්දියානු නීතිය මගින් ආවරණය කරනු ඇත්ද යන්න අවිනිශ්චිතය. කෙසේ වෙතත් ස්කොට්ලන්ත නීතිය එවැනි තත්වයන් සඳහා ද ප්‍රතිපාදන සපයයි.

එකඟත්වයක් රහිත අසභ්‍ය දර්ශන සම්බන්ධයෙන් වන නෛතික තත්වයන් වරදකරුවකු විසින් අදාල ක්‍රියාව වරදක් සංස්ථාපනය වීම උදෙසා කවර අන්දමේ සාවද්‍ය චේතනාවකින් සිදුකළ යුතුද යන්න සම්බන්ධයෙන් ලොව පුරා එකිනෙකට වෙනස් වූ තත්වයන් පවතී. එවන් ක්‍රියාවක් වරදක් වීම සඳහා වැරදිකරුවකු කුමන අන්දමේ චේතනාවකින් එය සිදුකළ යුතුද යන්න ඉන්දීය නීතියෙහි පෙන්වා දී නොමැත. කෙසේ වෙතත්, ස්කොට්ලන්ත නීතියට අනුව බලන කල, එකී ක්‍රියාව සිදු කළේ භීතිය, අනතුරු ඇඟවීම හෝ පීඩාව ඇති කිරීමේ අදහසින් ය; නැතහොත් එය වින්දිතයාට බිය, අනතුරු ඇඟවීම හෝ පීඩාවක් ඇති කරයිද යන්න පිළිබඳව අදාල වරදකරු නොසැලකිලිමත් ලෙස කටයුතු කර තිබීම අවශ්‍ය බවට පෙන්වා දී ඇත.

ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් හි අපරාධ පනතේ 91ච වගන්තිය ද කැමැත්තකින් තොරව රහස්‍ය රූප බෙදා හැරීමේ වරද සම්බන්ධයෙන් විධිවිධාන පෙන්වා දෙනු ලැබේ:

*91ච කැමැත්තකින් තොරව රහස්‍ය රූප බෙදා හැරීම*

*(1) වෙනත් පුද්ගලයෙකුගේ රහස්‍ය රූපයක් චේතනාන්විතවම බෙදා හරින පුද්ගලයෙකු -*

*(අ) අදාල පුද්ගලයාගේ අවසරයකින් තොරව, සහ*

*(ආ) බෙදා හැරීම සඳහා අදාල පුද්ගලයා එකඟ නොවූ බව දැන ගැනීම හෝ අදාල පුද්ගලයා එකී බෙදා හැරීමට එකඟ වූවේද නැද්ද යන්න සම්බන්ධයෙන් නොසැලකිලිමත්ව කටයුතු කර ඇත්නම් එවන් තැනැතකු අපරාධයක් සම්බන්ධයෙන් කරදකරු වේ.*

මෙම අවස්ථාවෙහිදී, කැමැත්තකින් තොරව රහස්‍ය රූපයක් බෙදා හරින සහ "බෙදා හැරීම සඳහා පුද්ගලයා එකඟ නොවූ බව හෝ *අදාල පුද්ගලයා එකී බෙදා හැරීමට එකඟ වූවේද නැද්ද යන්න සම්බන්ධයෙන් නොසැලකිලිමත්ව කටයුතු කර ඇත්නම්*" එකී ක්‍රියාව චේතනාන්විතවම සිදුකරනු ලබන තැනැත්තා වරදක් සිදු කරයි. මෙම වගන්තියෙහි විෂය පථය අදාල රහස්‍ය රූපය බෙදා හරිනු ලබන ප්‍රධාන මුල් පුද්ගලයාට පමණක් සීමා නොවී ඉන් ඔබ්බටද අදාල වේ. ඒ අනුව ගත් කල, අදාල තැනැත්තාගේ එකඟත්වයකින් තොරව බෙදාහරින ලද ඡායාරූපයක් ලබන පුද්ගලයකු විසින් එකී ඡායාරූපය තමන්ට ලැබීමෙන් පසුව අදාල පුද්ගලයා එකී බෙදා හැරීමට එකඟ වූවේද නැද්ද යන්න සම්බන්ධයෙන් නොසැලකිලිමත්ව කටයුතු කර එකී ඡායාරූපය නැවත බෙදාහැර ඇත්නම් එවන් තත්වයක් ද මෙම වගන්තියෙහි විෂය පථයට අයත් වේ. කෙසේ වෙතත්, රූපයේ මුල් බෙදාහරින්නා හැර වෙනත් පුද්ගලයෙකුගේ නොසැලකිලිමත් බව ඔප්පු කිරීම දුෂ්කර විය හැකිය.

## ශ්‍රී ලංකාව තුළ රහස්‍ය රූප හෝ වීඩියෝ බෙදා හැරීම පිළිබඳ වරදක් සංස්ථාපනය කිරීම සඳහා වන නිර්දේශයන්

රහස්‍ය රූප හෝ වීඩියෝ එකඟතාවයකින් තොරව බෙදා හැරීම සම්බන්ධයෙන් සාපරාධී වරදක් හඳුන්වා දිය යුත අතර එහි පහත අංගයන් අන්තර්ගත විය යුතුය.

- වරදකරු විසින් වින්දිතයාගේ කැමැත්තෙන් හෝ කැමැත්තක් නොමැතිව අදාල ඡායාරූපය හෝ වීඩියෝව ලබා ගත හැකිය. වැරදිකරුගේ සන්තකයට අදාල ඡායාරූපය ලැබුණු ආකාරය හෝ එය නිර්මාණය කළ ආකාරය සම්බන්ධයෙන් වින්දිතයාගේ කැමැත්ත නොතිබීම අත්‍යවශ්‍ය නොවේ.

- වින්දිතයා එකඟ නොවූ බව දැන දැනම හෝ වින්දිතයා එකඟ වූ බව විශ්වාස කිරීමට සාධාරණ පදනමක් නොමැති තාක් දුරට, අදාල ඡායාරූපය බෙදා හරින ලද අරමුණ සඳහන් කිරීම අත්‍යවශ්‍ය නොවේ.

- වරද සිදුවීම සංස්ථාපනය වීම සඳහා අදාල ඡායාරූපය වින්දිතයාගේ බව පෙනෙන්නට තිබිය යුතු අතර, එය සත්‍ය වශයෙන්ම වින්දිතයාගේ රූපයක් වීම අත්‍යවශ්‍ය නොවේ. එකී ඡායාරූපය අදාල වින්දිතයාගේ බවට හැඟෙන ලෙස සංස්කරණය කරන ලද හෝ ශීර්ෂ පාඨයක් යෙදූ එකක් වුවද එමගින් වින්දිතයාට නින්දාවක්, පීඩාවක් හෝ අනතුරු ඇඟවීමක් ඇති කරන බව දැන දැනම එය සිදු කළ හොත් එය මෙකී වරද යටතට ගැනේ.

- වින්දිතයාගෙන් නොව වැරදිකරුවෙකුගෙන් අදාල ඡායාරූපය හෝ වීඩියෝ පටය ලැබීමෙන් පසු, එම රූපය හෝ වීඩියෝ පටය වින්දිතයාගේ කැමැත්තෙන් තොරව බෙදා හැර ඇති බවට විශ්වාස කිරීමට එම පුද්ගලයාට දැනුම හෝ සාධාරණ හේතු තිබේ නම් සහ එවැනි තත්වයකදී ද  අදාල ඡායාරූපය හෝ වීඩියෝ පටය තවදුරටත් බෙදා හරින ලද පුද්ගලයෙකු ද මෙම වරද යටතේ ආවරණය වනු ලැබේ.
- මෙමඟින් එකඟත්වයෙන් යුත් ලිංගික ප්‍රකාශනය උල්ලංඝනය නොකරයි. එකඟත්වය සහිතව වැඩිහිටියන්ට ඔවුනොවුන් අතර ලිංගිකත්වය ප්‍රකාශ කෙරෙන ඡායාරූප හුවමාරු කර ගැනීමේ ඉඩප්‍රස්ථාව නීතිය මඟින් ලබාදිය යුතු අතර එහිදී එකී ඡායාරූප සහ වීඩියෝ ලබාගැනීම හෝ බෙදා හැරීම එකඟත්වය නොමැතිව සිදු කර නොමැති සේම මුලාකිරීම සහ / හෝ බලහත්කාරය භාවිත කරමින් එසේ සිදුකර තිබීම ද සිදු නොවිය යුතුය.

## ඇ. ලිංගික කප්පම් ගැනීම

### ලිංගික කප්පම් ගැනීම හෙවත් ලිංගිකත්වය උද්දීපනය කරන රූප, ලිංගික ප්‍රතිලාභ හෝ මුදල් වැනි දෑ ලබා නොදුනහොත් යමෙකුගේ රහස්‍ය හෝ සංවේදී පුද්ගලික දෑ බෙදාහරින බවට තර්ජනය කිරීම යනු කුමක්ද?

ලිංගිකත්වය උද්දීපනය කරන රූප, ලිංගික ප්‍රතිලාභ හෝ මුදල් වැනි දෑ ලබා නොදුනහොත් යමෙකුගේ රහස්‍ය හෝ සංවේදී පුද්ගලික දෑ බෙදාහරින බවට තර්ජනය කිරීම නම් වූ ක්‍රියාව කාන්තාවන්ට එරෙහි හිංසනය සහ ඊට පාදක වන හේතු සහ එහි ප්‍රතිවිපාකයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු විසින් විස්තර කරනු ලබන්නේ *"වින්දිතයෙකුව අවමානයට ලක්කිරීමේ තර්ජනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම (එහිදී) වින්දිතයාගේ පැහැදිලි අමතර ඡායාරූප, වීඩියෝ, ලිංගික ක්‍රියාවන් හෝ ලිංගිකත්වය කප්පම් ගැනීම පිණිස වින්දිතයාගේ රහස්‍ය ඡායාරූප මුදා හරිව බවට අපරාධකරු විසින් තර්ජනය කිරීමයි."* මෙය ඇතැම් විට 'ලිංගික කප්පම්' යන යෙදුමට ලබා දී ඇති විකල්ප අර්ථනිරූපණයට වඩා වෙනස් තත්වයක් වන අතර එහිදී අල්ලස් ලබාදීමක් හෝ දූෂණයක් යන අර්ථයෙන් පුද්ගලයෙකු යම් යම් ප්‍රතිලාභ ලබා දීම වෙනුවෙන් වින්දිතයෙකුගෙන් ලිංගික අනුග්‍රහය ලබා ගැනීම සඳහා අධිකාරියක් ඇති තනතුරක් අයුතු ලෙස භාවිත කිරීම (රජයේ නිලධාරියෙකු රැකියාවක් සඳහා වින්දිතයෙකුට ලිංගික කප්පම් ලබා ගැනීම) හෝ යම් යම් ප්‍රතිවිපාක වළක්වා ගැනීම සඳහා (අත්අඩංගුවට ගැනීමක් නොකර සිටීම සඳහා පොලිස් නිලධාරියෙක විසින් ඒ වෙනුවට වින්දිතයෙකුගෙන් ලිංගික කප්පම් ගැනීම වැනි) තත්වයක් අදහස් කෙරේ.[37]

ලිංගික කප්පම් ගැනීමේ ක්‍රියාව බොහෝ විට එකඟත්වයකින් තොරව රහස්‍ය රූප බෙදා හැරීම සමඟ සමීප අන්තර් සම්බන්ධයක් ඇති නමුදු, මෙකී ක්‍රියා ද්විත්වය හරයාත්මකව එකිනෙකට වෙනස් වේ. ඉන් එක් ක්‍රියාවක් වින්දිතයෙකුගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම සහ එකඟත්වයකින් තොරව රූපය හෝ වීඩියෝ බෙදා හැරීම මත පදනම් වේ. අනෙක් ක්‍රියාව වූ කලී ලිංගික කප්පම් ගැනීම මත පදනම් වූ ක්‍රියාවක් වන අතර, එහිදී යම් ප්‍රතිලාභයක් ලබා ගැනීම පිණිස රහස්‍ය රූපයක් හෝ වීඩියෝවක් (එකඟත්වයක් සහිතව හෝ රහිතව ලබාගෙන ඇති) පුද්ගලිකත්වය උල්ලංඝනය කිරීමක් කරන බවට තර්ජනය කිරීමක් සිදු කරයි.

බොහෝ විට, වැරදිකරුවකු විසින් වින්දිතයෙකුව (ඔවුන්ගේ සහකරු ද ඇතුළුව) ඔවුන්ට 'නිරුවත්' (නිරුවත් හෝ අර්ධ නිරුවත් පින්තූර හෝ වීඩියෝ දර්ශන) රූප යැවීමට හෝ ඔවුන් විසින් ලිංගික ක්‍රියාවන්හි නිරත වීම පටිගත කිරීමට ඒත්තු ගන්වනු ලබන අතර, පසුව සමහර ප්‍රතිලාභ අපේක්ෂාවෙන්, එනම්, තව දුරටත් ලිංගික ක්‍රියාවන්, මූල්‍යමය හෝ ද්‍රව්‍යමය වාසි ලබා ගැනීම, වින්දිතයා කෙරෙහි බලය තහවුරු කිරීම හෝ තමන්ට හිමිකර ගැනීම ආදී වශයෙන් වූ ප්‍රතිලාභයන් සඳහා එම රහස්‍ය රූප හෝ වීඩියෝ දර්ශන වෙනත් පුද්ගලයෙකුට, පුද්ගලයන්ට හෝ සම්පූර්ණයෙන්ම ප්‍රසිද්ධියේ බෙදා හරින බවට තර්ජනය කිරීම සිදු වේ.  වැරදිකරුවන් විසින් අත්‍යවශ්‍යයෙන්ම වින්දිතයාගෙන් ප්‍රතිලාභ ලබා

[37] සාරා කානගී, 'ලිංගික කප්පම් ගැනීම - දූෂණ හා ලිංගික සූරාකෑමේ අපරාධයක්', ජාත්‍යන්තර නීතිඥ සංගමය, 2019, පිටු 8
https://www.ibanet.org/Document/Default.aspx?DocumentUid=E5E451C2-A883-4518-B0ED5AAAEBCDD5AA

ගැනීම සඳහා එකඟතාවයකින් තොරව රහස්‍ය රූප බෙදා හැරීම පිළිබඳ තර්ජනය භාවිතා කරනු ලබයි. විශේෂයෙන් ම ශ්‍රී ලංකාව තුළ මෙම තත්වය එලෙස දක්නට ලැබෙන අතර, වට්ස්ඇප් වැනි සමාජ මාධ්‍ය වේදිකා හරහා ඉතා පහසුවෙන් ඡායාරූප හෝ වීඩියෝ ලබා ගැනීම, හුවමාරු කර ගැනීම සහ බෙදා හැරීම ඉතා ජනප්‍රිය කාරණයක්[38] වන අතර එය විශේෂයෙන්ම තරුණ කාන්තාවන්ට බලපාන තත්වයක් ඇත.[39]

ලිංගික කප්පම් ගැනීමේ ක්‍රියාව දර්ශාස්වාදය නම් ක්‍රියාව සමග ද අන්තර් සම්බන්ධතාවයක් ඇති අතර එසේ වන්නේ දර්ශාස්වාදය හරහා ලබාගත් ඡායාරූප හෝ පටිගත කිරීම් භාවිතා කර වින්දිතයාගෙන් ලිංගික කප්පම් ලබා ගැනීම සඳහා එය භාවිත කරනු ලබන කල්හිය.[40] මෙම අවස්ථාවෙහිදී ද, එවැනි ඡායාරූප හෝ වීඩියෝ නිකුත් නොකර සිටීම වෙනුවෙන් වින්දිතයාගෙන් ලිංගික ක්‍රියාවන්, මූල්‍යමය ත්‍යාග හෝ වෙනත් ප්‍රතිලාභ ඉල්ලා සිටිනු ලබනවා විය හැකිය.

කෙසේ වුවද, අදාල ඡායාරූපය හෝ වීඩියෝව සංසරණය වූ හෝ ප්‍රකාශයට පත් කළ අවස්ථාවන්හි දී වින්දිතයාගේ සැබෑ රූපය හෝ වීඩියෝව එහි අන්තර්ගත නොවී ඇති අවස්ථාවන් ද ඇත. එහිදී බොහෝ විට වින්දිතයා බව හැඟවීම සඳහා ඒවා අලංකාරවත්ව සකසා තිබීම හෝ 'ෆොටෝෂොප්' වැනි මෘදුකාංග ඔස්සේ වෙනස් ලෙස නිර්මාණය කර තිබිය හැකි අතර,[41] එසේ නැතහොත් මුහුණක් නොපෙනෙන විට ඒවා වින්දිතයාගේ බව හැඟවීමට අදාල නම සමග ප්‍රකාශයට පත් කළ හැකිය.[42] එවැනි අවස්ථාවන්හිදී, වින්දිතයාට ඔවුන්ගේම රූපය සංසරණය වූ හෝ සංසරණය වන බවට තර්ජනය කළ ආකාරයට සමාන කම්පනයක් ඇති විය හැකි වන්නේ එවැනි අන්තර්ගතයක් සහිත දෙයක් ලබන පුද්ගලයින් ඒ ඔවුන් යැයි විශ්වාස කරන හෝ එය විශ්වාස කරනු ලැබිය හැකි නිසාවෙන් වන අතර, එවැනි තත්වයකදී ඔවුන්ට කීර්තිය අහිමිවීම සහ අතවර වීම වැනි වෙනත් ප්‍රතිවිපාකවලට ද මුහුණ දීමට සිදුවිය හැකිය.

## පවත්නා නීතිය යටතේ එයට දඬුවම් කළ හැකිද?

එවැනි ඡායාරූපයක් හෝ වීඩියෝවක් ප්‍රකාශයට පත් කිරීම වැළැක්වීම සඳහා වින්දිතයෙකුගෙන් 'කිසියම් දේපළක් හෝ වටිනා ඇපයක් හෝ වටිනා ඇපයකට හැරවිය හැකි ව අත්සන් කරනු ලැබූ හෝ මුද්‍රා තබනු ලැබූ යමක් යමෙකුට දීම සඳහා යම් තැනැත්තකුට හෝ වෙනත් තැනැත්තකුට යම්

---

38 ළමා අයිතින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව, '2015 දී ලැබීමට නියමිත රාජ්‍ය පක්ෂවල පස්වන හා හයවන වර්ග වාර්තා ඒකාබද්ධ කිරීම - ශ්‍රී ලංකාව', සීආර්සී / සී / එල්කේඒ / 5-6, 67 ඡේදය. ලබා ගත හැකිය: https://www.mfa.gov.lk/wp-content/uploads/2018/03/CRC4.pdf

39 'ශ්‍රී ලංකාවේ' නිරුවත් 'සංස්කෘතිය විමර්ශනය කිරීම', ග්‍රාස්රූට්.නෙට්, 2017 ජනවාරි, ලබා ගත හැක්කේ: http://www.grassrooted.net/2017/01/27/investigating-sri-lankas-nude-culture/

40 '2017 දී රහස් පොලිසියට පැමිණිලි කිරීම - බිඳී යාමෙන් පසු සමාජ මාධ්‍ය බිය ගැන්වීම වඩාත් සුලභයි', ඩේලි නිවුස්, 2019 සැප්තැම්බර් 23, ලබා ගත හැකිය: https://www.dailynews.lk/2019/09/23/local/197651/social-media-intimidation-after-break-most-common මෙයද බලන්න: 'වින්දිතයින්ගේ නිරුවත් ඡායාරූප සැඟවීමට දර්ශාස්වාදකයකු ලිංගික අල්ලස් ඉල්ලා සිටියේය', ඩේලි නිවුස්, 2015 සැප්තැම්බර් 29, ලබා ගත හැකිය: http://www.dailynews.lk/2015/09/29/security/voyeur-demanded-sex-bribes-hide-victims-nude-photos?page=16

41 මැක්ග්ලින්, සී., රැක්ලි, ඊ. සහ හූටන්, ආර්. ඉන් ඔබ්බට 'පළිගැනීමේ අසභ්‍ය දර්ශන': රූප මත පදනම් වූ ලිංගික අපයෝජනයේ අඛණ්ඩතාව. Fem Leg Stud 25, 25-46 (2017), 33 වන පිටුව, ලබා ගත හැකිය: https://link.springer.com/content/pdf/10.1007/s10691-017-9343-2.pdf

42 "මෙම වීඩියෝ පට මගේ ජීවිතය අවදානමට ලක් කරයි" - කාමුක ලැජ්ජාව ඉලක්ක කරගත් ශ්‍රී ලාංකික මාධ්‍යවේදියෙක් ", 2016 මැයි 16. https://endsexualexploitation.org/articles/revengeporn-targeted-google/

පාඩු කිරීමේ බියක් ඔනෑකමින් ම ඇතිකර වීමෙන් ඒ තැනැත්තා වංක ලෙස  පොළඹවගතොත්', එවැනි ක්‍රියාවක් දණ්ඩ නීති සංග්‍රහය යටතේ බලෙන් ලබාගැනීමක් වනු ඇත.[43] කෙසේ වෙතත්, වින්දිතයා සමඟ පුද්ගල සම්බන්ධතාවයක රැඳී සිටීමට හෝ වරදකරු සමඟ ලිංගික ක්‍රියාවන් කිරීමට අවමන් කිරීමේ තර්ජනයක් පවතින අවස්ථා මෙමඟින් ආවරණය නොවීමේ ඉඩ ප්‍රස්ථාව ඇත.

තම නිරුවත් ඡායාරූප මුදා හරිනු ලබන බවට යම් කාන්තාවක් තර්ජනයෙන් බිය ගන්වමින් පිරිමියෙකු සමඟ ලිංගික සංසර්ගය සඳහා බල කරන්නේ නම්, එමඟින් දණ්ඩ නීති සංග්‍රහයේ 363 (ආ) වගන්තියට අනුව ස්ත්‍රී දූෂණය නම් වරද සංස්ථාපනය විහ හැකිය. "බලහත්කාරය පාවිච්චි කිරීමෙන් හෝ තර්ජනය කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන් හෝ ඇගේ කැමැත්ත ලබා ගත් විට ඇගේ කැමැත්ත ඇතිව". කෙසේ වෙතත්, දූෂණයට ගොදුරු වූවෙකු ලෙස කාන්තාවක් පමණක් නීතිය මගින් හඳුනාගෙන ඇති අතර එමඟින් මෙම ආරක්ෂාව වෙනත් ලිංගභේදයන් ආවරණය වීමට තරම් පුළුල් නොවේ.[44] එය යම් හෙයකින් ස්ත්‍රී දූෂණයක් සංස්ථාපනය නොවන වෙනත් ලිංගික ක්‍රියාවක් නම් (එනම් යෝනි මාර්ගයට පුරුෂ ලිංගේන්ද්‍රයක් ප්‍රවේශ වීමක් නොමැති), එය දණ්ඩ නීති සංග්‍රහයේ 365ආ (ආ) වගන්තිය යටතේ බරපතල ලිංගික අපයෝජනයක් විය හැකිය. මෙය වින්දිතයින් බවට පත්විය හැකි තැනැත්තන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව සලකා බලනු ලබන වරදක් නොවන මුත් අඩු දණ්ඩනයක් හිමි වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව සහතික කර ඇති අයිතියක් වශයෙන් හෝ යම් වෙනත් නීතියක් හරහා සහතික කරන ලද අයිතිවාසිකමක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ පෞද්ගලිකත්වයට ඇති අයිතිය උල්ලංඝණය වූ විට ඊට දණ්ඩන ප්‍රතිවිපාකයක් සහිත වරදක් වශයෙන් එය පිළිගනු ලබන්නේ නැත.[45] කෙසේ නමුත්, එකඟත්වයකින් තොරව අසභ්‍ය දර්ශන හුවමාරු කරගැනීම වූ කලී, පුද්ගලිකව තබා ගැනීමට අදහස් කළ වින්දිතයාගේ ජීවිතයේ රහස්‍ය කොටසක් ප්‍රසිද්ධියට පත්වීම සිදුවන නිසාවෙන් එමඟින් වින්දිතයාගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීමක් සිදු වේ. මෙවන් වූ වැදගත් ආරක්ෂාවක් නෛතික වශයෙන් හඳුනා නොගැනීම රටේ නීතියෙහි පවතින අඩු ලුහුඬුකමක් වශයෙන් පෙන්වා දිය හැකිය.

## ලිංගික කප්පම් ගැනීම පිළිබඳ ජාත්‍යන්තරමය වශයෙන් පවතින නෛතික විධිවිධානයන්හි තත්වය

ලිංගික කප්පම් ගැනීමේ ක්‍රියාව සම්බන්ධයෙන් වන ගැටළු ආමන්ත්‍රණය කිරීම උදෙසා ජාත්‍යන්තරමය වශයෙන් නීතිමය විධිවිධාන කිහිපයක් තිබේ. රහස්‍ය ඡායාරූප හෝ වීඩියෝ බෙදා හැරීම පිළිබඳ ස්කොට්ලන්ත නීතිමය තත්වය හරහා ලිංගිකව කප්පම් ගැනීමේ ක්‍රියාවක් වුවද අපරාධයක් සංස්ථාපනය කරනු ලබන බවට අර්ථ දැක්වීම හැකි වන්නේ  වැරදිකරු විසින් වින්දිතයාගේ ඡායාරූපයක් හෝ වීඩියෝවක් හෙළි කරනු ලබන බවට තර්ජනය කිරීම තහවුරු කිරීමම එකී වරද සංස්ථාපනය වීමට ප්‍රමාණවත් බැවිනි. කෙසේ නමුත්, මෙහිදී සාපරාධී ක්‍රියාවක් වශයෙන් සංස්ථාපනය

---

[43] 372 වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහය, සහ 374 වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම්. 372 වන වගන්තියේ පළමු නිදර්ශනයේ මෙසේ සඳහන් වේ. ''ඉසෙඩ්'' තමාට මුදලක් නොදුනහොත්, ඔහු සම්බන්ධයෙන් ලිඛිත ප්‍රකාශයක් ප්‍රසිද්ධ කරන බවට ''ඒ'' තර්ජනය කර ඔහුට මුදලක් දීමට ''ඉසෙඩ්'' පොළඹවයි ''ඒ'' බලෙන් ලබා ගැනීම කර ඇත.

[44] මෙම ලිපි මාලාවේ I කොටස බලන්න; ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට එරෙහිව නීතිමය ප්‍රතිසංස්කරණයක් - 1 වන කොටස - පවත්නා නීති සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2020 නොවැම්බර්

[45] ඉහත එම, 'ශ්‍රී ලංකාවේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය', සාකච්ඡා පත්‍රිකාව, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය'

වන්නේ සත්‍ය වශයෙන්ම, අදාල ඡායාරූපය හෙළි කරන බවට තර්ජනය කිරීමේ ක්‍රියාව මිස යමක් බලෙන් ලබා ගැනීමේ ක්‍රියාව නොවන අතර එය වෙනත් වරදක් වශයෙන් පවතී.

## ශ්‍රී ලංකාවේ ලිංගික කප්පම් ගැනීමේ ක්‍රියාව වරදක් වශයෙන් සංස්ථාපනය කිරීම සඳහා අවැසි නිර්දේශයන්

ලිංගික කප්පම් ගැනීමේ ක්‍රියාව සාපරාධී වරදක් ලෙස හඳුන්වා දිය යුතු අතර, එය රහස්‍ය රූප හෝ වීඩියෝ බෙදා හැරීමකට වඩා වෙනස් වන අතර, එමඟින්:

- වරදකරු විසින් ලිංගික තොරතුරු, ඡායාරූප හෝ වීඩියෝ මුදා හැරීමේ තර්ජනය භාවිත කරමින්: වින්දිතයාගෙන් ලිංගික ඡායාරූප හෝ වීඩියෝ බලෙන් ලබා ගැනීම; වින්දිතයාට ක්‍රියාවක් කිරීමට හෝ ක්‍රියාවක් කිරීමෙන් වැලකීමට; හෝ වින්දිතයාගෙන් වෙනත් ද්‍රව්‍යමය හෝ මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම ට ක්‍රියා කරනු ලබන අවස්ථාවන් ආවරනය කිරීමට පුළුල් වීම.
- දණ්ඩ නීති සංග්‍රහයට නව වගන්තියක් හඳුන්වා දීමෙන් හෝ එහි දැනට පවතින බලෙන් ලබා ගැනීම සම්බන්ධයෙන් පවත්නා විධිවිධාන සංශෝධනය කිරීමෙන් ලිංගික කප්පම් ගැනීමේ ක්‍රියාව ද ආවරණය කිරීමට තරම් පුළුල් වන පරිදි ඒවා ගෙන ඒමට හැකි වීම.
- වින්දිතයාට තර්ජනය කරන ක්‍රියාවන් වූ කලී ලිංගික සංසර්ගය සහ වෙනත් ලිංගික ක්‍රියාවන්; වැරදිකරු සමඟ සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමට සිදුවීම්; හෝ අපරාධකරු විසින් සිදු කරන ලද යම් සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වාර්තා නොකිරීමට සිදුවීම ආදි තත්වයන් ආවරණය වීම සිදුවිය යුතුය.

## මාර්ගගත ලිංගික හිංසනය සම්බන්ධයෙන් වන ඵලදායී නීති සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ

මෙම වාර්තාවෙහි ඉහත නිර්දේශ කර ඇති නෛතික ප්‍රතිසංස්කරණවලට අමතරව, ඒවා සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන පහත දැක්වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය, නෛතික හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණයන් නිර්දේශ කරනු ලැබේ. අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ ඇති අඩුලුහුඬුකම් සම්බන්ධයෙන් පිළියම් යෙදීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රතිසංස්කරණ මාලාවක් නිර්දේශ කර ඇති මෙම ලිපි මාලාවේ 1 වන කොටස[46] සමඟ මෙය කියවිය යුතුය.

### *1. පෞද්ගලිකත්වයට ඇති අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව පිළිගැනීම*

මෙම අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට ඇතුළත් කළ යුතු අතර, පුද්ගලයකුගේ පෞද්ගලිකත්වය රජය විසින් උල්ලංඝනය නොකිරීමට ඇති අයිතිය මෙන්ම, එහි පුරවැසියන්ගේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය වෙනත් පුරවැසියෙකු විසින් උල්ලංඝනය නොකරන බව, එවැනි උල්ලංඝණය කිරීමක් සිදුවන අවස්ථාවන්හිදී ඊට සුදුසු පිළියම් යෙදීමට කටයුතු කරන බව සහ එකී අයිතිවාසිකම සහතික කිරීම සඳහා අවැසි සාධනීය ක්‍රියාකාරී පියවර ගැනීම සඳහා රජයේ යුතුකම පිළිගැනීම ද ඇතුළත් විය යුතුය.

### *2. විමර්ශනය සහ නඩු විභාගයේදී වින්දිතයෙකුගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා අවැසි විධිවිධාන ඇතුළත් වන පරිදි අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම*

ඒ අන්දමින් වන ලිංගිකත්වය පිළිබිඹු කෙරෙන ඡායාරූප හෝ වීඩියෝ දර්ශන කැමරාවක් අධාරයෙන් ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසීමට හැකිවන පරිදි අපරාධ නඩු විධාන සංශෝධනය කළ යුතු අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී (එවන් අවස්ථාවකදී වුවද නිසි අන්දමට අදාල පුද්ගලිකත්වය සහතික කෙරෙන පරිදි) හැර අධිකරණ වාර්තාවන්හි හෝ ගබඩා කර නොතැබීමට වගබලාගත යුතුවේ. විමර්ශන සහ නඩු විභාග කටයුතු අතරතුර දී වින්දිතයාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම වැදගත් වේ. ලිංගිකත්වය නිරූපණය කරන ලද ඡායාරූපයක් හෝ වීඩියෝවක් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළ විට, එම ඡායාරූපය හෝ වීඩියෝ පටය වෙත නීත්‍යානුකූලව හෝ නීති විරෝධී ලෙස අධිකරණ නිලධාරීන්, නීතිඥයින් සහ මාධ්‍ය විසින් ප්‍රවේශ වීමේ හැකියාව පවතින නිසාවෙන් අධිකරණ වාර්තාවන්හි කොටසක් වශයෙන් ඒවා ගබඩා නොකිරීමට නීතියෙන් අවසර දීමේ විධිවිධානයන් ඇතිකළ යුතුය.

### *3. වින්දිතයා සහ සාක්ෂිකරු ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වර්තමානයෙහි පවත්නා වැඩපිළිවෙල තවදුරටත් ශක්තිමත් කිරීම*

වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වර්තමානයෙහි පවතින ක්‍රමවේදයෙහි ඇති අඩු ලුහුඬුකම්, විශේෂයෙන් අපරාධයන්හි වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියට අදාළව, ඒ කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර, සමස්තයක් ලෙස වින්දිතයා සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ක්‍රමවේදය නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතුය (මෙම ලිපි මාලාවේ

[46] ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට එරෙහිව නීතිමය ප්‍රතිසංස්කරණයක් - 1 වන කොටස - පවත්නා නීති සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2020 නොවැම්බර්

1 වන කොටස බලන්න - වින්දිතයා සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ පූර්ණ සාකච්ඡාවක් කෙරේ). මෙම ලිපියේ යෝජනා කර ඇති වැරදි තුන සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා සමාජ සන්දර්භය සහ වින්දිතයින්ට ඇති වන අනේකවිධ ප්‍රතිවිපාක සැලකිල්ලට ගෙන වින්දිතයාගේ පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් විධානය දැක්වීම විශේෂයෙන් වැදගත් වේ. වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ දුර්වල ක්‍රමවේදයක් පවතින අවස්ථාවක එහි ප්‍රතිඵලයක් වශයෙන් මාර්ගගත ලිංගික හිංසනයන්ට ගොදුරු වූවන් ඉදිරියට පැමිණීමට පසුබට වන අතර එමඟින් වැරදිකරුවන්ට දඬුවම් නොලැබ සිටීමේ මුක්තියක් ද හිමිවේ.

### *4. තාක්ෂණික වශයෙන් මධ්‍යස්ථ භාෂා භාවිතයක් මඟින් අපරාධ නීති කෙටුම්පත් කර ඒවා සමාලෝචනය කර යාවත්කාලීන කිරීම*

තාක්ෂණය පරිණාමය වන විට ඉස්මතු විය හැකි නව අවස්ථාවන් අන්තර්ගත කිරීමට හැකිවන පරිදි අපරාධ නීති කෙටුම්පත් කළ යුත්තේ තාක්ෂණිකව මධ්‍යස්ථ භාෂාවෙනි. පවත්නා සාපරාධී විධිවිධාන (විශේෂයෙන් අලුතින් හඳුන්වා දුන් ඒවා) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඇගයීමක් කිරීම සඳහා අපරාධ නීති නිසි කලින් කලට සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා රජය විසින් ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. මෙමඟින් වර්තමානයෙහි පුරෝකථනය කළ නොහැකි තාක්ෂණික දියුණුව විකාශනය හේතුවෙන් උද්ගත වන නීතිමය අවශ්‍යතා සපුරාලීමට සහ නීති යල්පැනගිය තත්වයට පත්වීම වැළැක්වීමට හැකියාව ලැබේ.

### *5. ශ්‍රී ලංකා පොලිස් සයිබර් අපරාධ ඒකකය තුළ මාර්ගගත ලිංගික හිංසනය සම්බන්ධයෙන් විශේෂිත ඒකකයක් ස්ථාපිත කිරීම*

එකී විශේෂ ඒකකය සඳහා:

- මාර්ගගත ලිංගික හිංසනය පිළිබඳ අපරාධ (දැනට පවත්නා නීති රාමුව යටතේ හෝ අනාගතයේදී සංශෝධනය කිරීමෙන් පසු තත්වය යටතේ) සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය කුසලතා පිළිබඳ පුහුණුව ලබා දීම.
- ලිංගික හිංසනය මඟින් වින්දිතයෙකුට ඇති කළ හැකි මානසික බලපෑම පිළිබඳ අවබෝධයක් සහිතව සංවේදීතා පුහුණුව ලබා දීම.
- නිශ්චිත භූගෝලීය පිහිටීම නොසලකා වැරදි විමර්ශනය කිරීමේ ධාරිතාවය වැඩිදියුණු කර තිබීම.
- වින්දිතයින්ට පහසුවෙන් පැමිණිලි කලහැකි වන අන්දමට නිසි පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් භාවිතා කරමින්, පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට, දුරකථන හා මාර්ගගත ප්‍රවේශ ස්ථාන භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වා ගත යුතු අතර, ඔවුන්ගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය වේ යැයි කිසිදු බියකින් තොරව පැමිණිලි ඉදිරිපත් කළ හැක තත්වයක් පැවතිය යුතු වේ.

### *6. මාර්ගගත ලිංගික හිංසනයන්ට ගොදුරු වූ පුද්ගලයින් සඳහා උපදේශන සේවා සැපයීම*

මහජන සෞඛ්‍ය සේවා හරහා හෝ රජයේ පහසුකම් සැපයීම තුළින් උපදේශන හා මානසික සෞඛ්‍ය සේවාවන් පුළුල් කිරීම, වර්තමානයෙහි සේවයෙහි නියුතු සහ නව උපදේශන වෘත්තිකයින්ගේ ප්‍රමාණවත් පුහුණුව සහ අවශ්‍ය අවස්ථාවන්හිදී රාජ්‍ය නොවන උපදේශන සේවා (නිදසුනක් වශයෙන් පුද්ගලික හෝ රාජ්‍ය නොවන සංවිධාන උපදේශන සේවා සපයන්නන්) සමඟ අන්තර් සම්බන්ධ වීම තුළින් මාර්ගගත ලිංගික හිංසනයන්ට ගොදුරු වූ අවශ්‍යයෙන්ම එකී සේවාවන් ලබා දිය යුතුම පුද්ගලයින්ට අවැසි සේවාවන් ලබාදීම කල යුතුය. වින්දිතයන්ට පොලීසිය හා අධිකරණ පද්ධතිය සමඟ සම්බන්ධව කටයුතු කිරීමේ දී පහසුවෙන් උපදේශන සේවා ලබා ගත හැකි වියයුතුය.

### *7. මාර්ගගත අවදානම් සහ අන්තරායන් ආවරණය කරන සහ අන්තර්ජාලය හරහා පෞද්ගලිකත්වය ආරක්ෂා කරගත හැකි අන්දමේ පුළුල් ලිංගික අධ්‍යාපනයක් හඳුන්වා දීම*

අන්තර්ජාලය තුළ ලිංගික ප්‍රකාශනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම සහ ඒ හා සම්බන්ධ අවදානම්, අන්තරායන් සහ මාර්ගගතව කටයුතු කිරීමේ දී පුද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා අවැසි පියවර ආදී අංගයන් ඇතුළත් වන පරිදි පාසල් විෂය මාලාවට පුළුල් ලිංගික අධ්‍යාපනයක් හඳුන්වා දීම කලයුතු වේ. තරුණ පුරවැසියන්ට, විශේෂයෙන් ගැහැනු ළමයින්ට, ඔවුන්ගේ සහකරුවන් හෝ වෙනත් පුද්ගලයින් විසින් රහස්‍ය ඡායාරූප සහ වීඩියෝ හුවමාරු කර ගැනීමට පීඩාවට පත් කිරීම හෝ බල කිරීම වැනි අහිතකර හා සාපරාධී හැසිරීම් හඳුනා ගැනීමට සහ ඒවාට ආමන්ත්‍රණය කිරීමට හැකිවන පරිදි මෙම තත්වය ප්‍රවර්ධනය කලහැකි අතර; ඩිජිටල් ලෝකය තුළ ආරක්ෂිතව ඔවුන්ගේ ලිංගිකත්වය ආරක්ෂා වන අන්දමට කටයුතු කරනු ලබන්නේ කෙසේද (පුළුල් ලිංගික අධ්‍යාපනයක් සම්බන්ධයෙන් විස්තරාත්මක සාකච්ඡාවක් සඳහා මෙම ලිපි මාලාවේ I වන කොටස බලන්න) යන්න සම්බන්ධයෙන් පියවර ගතයුතු වේ.